# කෙටුම්පත

# ශ්‍රී ලංකාව සඳහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**1.** ප්‍රතිපත්තියේ නම

## 2. බලාත්මක දිනය

අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබීමෙන් පසුව සඳහන් කිරිමට නියමිතය.

## 3. හැඳින්වීම

### පසුබිම

පසුගිය දශක කිහිපය තුළ අත් කර ගත් ආර්ථික සංවර්ධනය හේතුවෙන් උග්‍ර දරිද්‍රතාවය තුරන් කරමින් මැදි ආදායම් රටක් වීමට ශ්‍රී ලංකාවට හැකිවී තිබේ. කෙසේවෙතත්, එය ආදායම් විෂමතා, සමාජීය ගැටලු සහ ස්වභාවික සම්පත් පරිභෝජනයේ සීඝ්‍ර වැඩිවීමක් සහ උග්‍ර පාරිසරික බලපෑම් සඳහා හේතු කාරක වී තිබේ. ජනගහණ වර්ධනය සහ සීඝ්‍ර නාගරීකරණය මගින් පාරිසරික ගැටලු උත්සන්න වී ඇති අතර එහි ප්‍රතිඵලය වන්නේ මානව පැවැත්ම සඳහා අවශ්‍ය ස්වභාවික සම්පත් හීන වීමයි.

ඉමහත් අපේක්ෂාවන්ගෙන් සමන්විත ශ්‍රී ලංකාවේ වත්මන් සංවර්ධන මෙහෙයුම නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සම්ප්‍රදායික ශ්‍රී ලාංකික ජීවන රටාව කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරමින් තිබේ. නාගරික ජනගහණයට සම්බන්ධ රාත්‍රී කාල ආලෝක දත්ත භාවිතා කරමින් මනිනු ලැබූ පරිදි, මෙම කලාපයේ වර්ෂ 1999 සහ 2010 කාල පරාසය අතර වඩාත්ම වේගවත් නාගරික ප්‍රදේශ ව්‍යාප්තිය සහිත රට වූයේ ශ්‍රී ලංකාවයි. නගරාංග පැතිරීම සහ තීරු සංවර්ධනය ශ්‍රී ලංකාවේ මූලික ගතිලක්ෂණයක් වේ[1]; (වඩා හොඳ යටිතල පහසුකම්, තම දරුවන් සඳහා හොඳ අධ්‍යාපනයක්, රැකියා අවස්ථා ආදිය ලබා ගැනීම සඳහා ජනතාව නගර කරා පැමිණෙමින් තිබේ) රටේ දැනට පවතින සාමකාමී වතාවරණය සහ ස්ථාවරභාවය නිසා එලෙස පැමිණෙන සංඛ්‍යාව තව දුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තිරසර නොවන පරිභෝජනය සහ නිෂ්පාදන රටා සමග නාගරීකරණය ව්‍යාප්ත වෙමින් පවතින අතර මැදි ආදායම් තත්ත්වය කරා වර්ධනය වන ජනගහණයේ අපේක්ෂාවන්, සමස්ත පාරිභෝජන සහ නිෂ්පාදන චර්යාව වෙනස් කරනු ඇත. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටක ආර්ථිකය සීඝ්‍රයෙන් වර්ධනය වීමේදී, එය බොහෝ විට දිගු කාලීන ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අවශ්‍ය වන ප්‍රයෝජනයට ගත හැකි ස්වභාවික සම්පත් ඉක්මවමින් භාවිතා කිරීමට නැඹුරුවන අතර එම ක්‍රියාදාමයන් බෙහෙවින් නාස්තිකාර වියහැක. මිනිස් ක්‍රියාකාරකම් හරහා පරිසරයට බැහැර වන අපද්‍රව්‍ය කාලයත් සමග දරා ගැනීමට හා පිරිසිදු කිරීමට ඇති හැකියාව හීනවන අතර ඒ හේතුව නිසා ජෛව විවිධත්වය සහ ජීවිතාධාරක පාරිසරික පද්ධතීන් සැලකිය යුතු අන්දමින් බිඳ වැටීමට ලක්වේ.

වත්මන් ශ්‍රී ලාංකික පාරිසරික ප්‍රතිපත්ති ලේඛනවල විශේෂ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර ලෙස බලශක්තිය, ජලය, අපද්‍රව්‍ය ආදිය හඳුනාගෙන ඇති අතර ඒ සඳහා අපේක්ෂිත ඉලක්ක පනවා තිබේ. කෙසේ වෙතත් මෙම ඉලක්ක වැඩි ප්‍රමාණයක් මෙතෙක් සපුරා ගෙන නොමැත. ප්‍රධාන වශයෙන් කසල බැහැර කිරීමට විවෘත බිම් භාවිතා කරමින් සිදුකෙරෙන නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තවමත් ශ්‍රී ලංකාවේ ඉතා බරපතල පාරිසරික ගැටලුවක්ව පවතී.පාරිසරික උපද්‍රව ගණනාවක් ඇති වන නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් සහ යටිතල පහසුකම් දැනට නොපවතී. සීඝ්‍ර නාගරීකරණය සහ කාර්මීකරණයෙන් සිදුවන වායු දූෂණය බරපතල ගැටලුවක්ව පවතී. විවිධ ස්ථානවල සිදු කරන වායු තත්ත්ව අධීක්ෂණය මගින් පෙන්නුම් කරන්නේ වායු දූෂණය ඉහළ යමින් පවතින බවයි· ප්‍රධාන නගරවල ඕසෝන්, සල්ෆර් ඩයොක්සයිඩ් සහ ශුද්‍ර දූවිලි අංශු ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියම කර ඇති ප්‍රමිති සීමා ඉක්මවා ගොස් ඇත.[2] ජල දූෂණය ශ්‍රී ලංකාවේ ආරක්ෂිත පානීය ජල සැපයුමටදැඩි බලපෑමක් කොට ඇත. ශ්‍රී ලංකාවේ නිවාස වලින් සියයට 86කට පමණ ආරක්ෂිත පානීය ජල සැපයුම ඇතත් ඒ ඒ ප්‍රදේශ අනුව වෙනස්කම් පවතී. නාගරික සහ වැවිලි බෝග ආශ්‍රිත ප්‍රදේශ සැලකුවිට නාගරික ප්‍රදේශවල එය සියයට 97.2 ක පමණ වැඩි අගයක් ද වතු ආශ්‍රිත ප්‍රදේශ වල

[1] http://www.worldbank.org/en/news/press-release/2015/09/29/urbanization-offers-sri-lanka-major-economic-opportunity

[2] http://srilankanscientist.com/colombo-air-too-is-polluted-says-who/

එය සියයට 50.6 ක පමණ අඩු අගයක්ද වේ[3].සංවර්ධිත රටවල් හා සැසඳීමේදී ගෝලීය උණුසුම සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය නොගිණිය හැකි තරම් කුඩා වුවත් ගෝලීය දේශගුණික වෙනස්කම්වල බලපෑම්වලට ලක් වීම ඉතා ඉහළය. කෘෂිකාර්මික ඉඩම්වලින් විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගත නොහැකිවනු ඇත්තේද දේශගුණික වෙනස්කම් නිසා විය හැක.

තිරසර නොවන සංවර්ධනයේ නිශේධනීය බලපෑම් අවබෝධ කරගත් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර ප්‍රජාව සමග අත්වැල් බැඳ ගනිමින් ති.ප.නි පිළිබඳ "දස අවුරුදු වැඩසටහන් රාමුව" ඇතුලුව ගෝලීය "න්‍යාය පත්‍රය 21" සහ "රියෝ +20 ප්‍රතිඵල" සහ නියමු 'තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය' සමග එහි තිරසර සංවර්ධන ඉලක්ක පිටසන් කර තිබේ.

*තාර්කිකය*

පරිසරය ආරක්ෂා කරගනිමින් සහ ස්වභාවික සම්පත් තිරසරව කළමනාකරණය කරමින් ආර්ථික සංවර්ධනය සහ සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීම තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනයේ අරමුණු වේ.

සමාජීය අවශ්‍යතා සපුරාලමින් පරිසර හිතකාමී බව තහවුරු කරමින් දිගු කාලීන ආර්ථික වර්ධනයක් ලගාකර ගැනීම තිරසර සංවර්ධනයේ මූලික අරමුණ වන අතර ඒ සඳහා තිරසර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වේ. අහිතකර පාරිසරික සහ සමාජීය බලපෑම් සීමා කරමින් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ සහ සේවා සඳහා වෙළඳපොලක් සැකසීමට තිරසර පරිභෝජනය ඉතා වැදගත් වේ.

අඩු වරප්‍රසාදිත පිරිස් ඇතුළුව සියලුදෙනාගේම මූලික අවශ්‍යතාවන ආහාර, නිවාස, සෞඛ්‍යය, ගමනාගමනය සහ අධ්‍යාපනය ආදී සේවා සැපයීම තුලින් ජීවිතයේ ගුණාත්මකභාවය නංවාලීම සඳහා පාරිසරික හිතකාමී ලෙස ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමට තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය අවශ්‍ය වේ. මෙහිදී ආර්ථික සංවර්ධනය සමග සිදුවියහැකි පාරිසරික හායනය වෙන්කිරීම ඉතා වැදගත් වේ.

විමෝචනය සහ සම්පත් නාස්තිය අවම කරමින් අඩු සම්පත් ප්‍රමාණයක් භාවිතා කරමින් වැඩි සමෘද්ධිමත්බවක් ලබා ගැනීම ති.ප.නි. මගින් ඇති කරනු ලබයි. තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය වඩාත් උචිත වන්නේ ආර්ථික, සමාජීය සහ පාරසරික ත්‍රිත්ව ජයග්‍රහණයකට එය හේතුවන බැවිනි.

ති.ප.නි. නිෂ්පාදක සහ පරිභෝගික දෙපාර්ශ්වයටම එකසේ ප්‍රතිලාබ ඇතිකරනු ලබයි. තවද සම්පත් ඉතිරිය සහ කාර්යක්ෂම භාවිතය මගින් ඵලදායීතාව ඉහළ නැංවීම නිසා භාන්ඩයක හා සේවාවක ගුණාත්මකබව ඉහල දැමීමත් යොදන ලද මුදලට ඉහල වටිනාකමක් ලබා දීමත් ති.ප.නි. මගින් ඇතිකරනු ලබයි. හරිත තාක්ෂණ සහ නිෂ්පාදන සඳහා කරනු ලබන ආයෝජනයන්ට ඉහල ප්‍රතිලාභ ලබාදීම ති.ප.නි. මගින් සිදුකරනු ලබයි.

සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාව, තිරසර යටිතල පහසුකම් සහ මූලික සේවා වෙත ප්‍රවේශය සැපයීම, හරිත හා සුනිසි රැකියා අවස්ථා සුලබ කරමින් සැමොම සඳහා වඩා ගුණාත්මක ජීවිතයක් ලගා කිරීම ති.ප.නි. මගින් සිදුකරනු ලබයි. තවද එය සමස්ත සංවර්ධන සැලසුම් සපුරා ගැනීම, අනාගත ආර්ථික, පාරිසරික සහ සමාජ පිරිවැය අඩුකිරීම, ආර්ථික තරඟකාරිත්වය ශක්තිමත් කිරීම සහ දරිද්‍රතාව අඩුකිරීම සඳහා ඉවහල් වේ.

ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම, භාන්ඩ හා සේවාවවල සමස්ත ජීවන චක්‍රය පුරා සම්පත් භාවිතය, හායනය සහ දූෂණය අඩුකිරීම මගින් ආර්ථික ක්‍රියාකාරකම් වලින් ජනිත වන ශුද්ධ සුබසාධන ප්‍රතිලාභ ඉහළ නංවමින්, "අඩු සම්පත් භාවිතයෙන් වැඩි නිෂ්පාදන ප්‍රමානයක් ලබාගැනීම" ති.ප.නි මගින් අරමුණු කරයි.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා නිෂ්පාදනය සහ පරිභෝජනය සමගාමීව ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම ති.ප.නි. හඳුනා ගනියි. පරිසර හිතකාමී පරිචයන් සහ නිමැවුම්, හරිත සහ සාධාරණ නිෂ්පාදන සඳහා සඵල ඉල්ලුමකින් තොරව ලබා ගත නොහැකි වනු ඇත. මේ සඳහා ප්‍රධාන බාධකයක්ව පවතිනුයේ පාරිභෝගික කණ්ඩායම් අතර දැනුවත්බව සහ සවිබලගැන්වීම නොමැති වීම වන අතර ඒ සඳහා පිළියම් යෙදීම අවශ්‍ය වේ.

[3] ගෘහ ආදායම් සහ වියදම් සමීක්ෂණය-2006/07 -ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව

ති.ප.නි. එකම කාසියක දෙපැත්ත සේ දැකිය හැක. එම සංරචක දෙක එකිනෙක අනුපූරණය කරමින් අනොන්‍යව ශක්තිමත් කරයි. තිරසාර නිෂ්පාදන සඳහා ඉල්ලුම උත්තේජනය කිරීම, නිෂ්පාදන රටාවන්ට බලපාන අතර තිරසර නිෂ්පාදන පැවැතීම ඉල්ලුම ප්‍රවර්ධනය කරනු ඇත.

නිෂ්පාදකයා සිට පාරිභෝගිකයා දක්වා සැපයුම් දාමයේ ක්‍රියාත්මක වන සියලු ක්‍රියාධරයන් අතර ක්‍රමික ප්‍රවේශයක් සහ සහයෝගීතාවක් අවශ්‍ය කරන්නා වූ ව්‍යාපාර, පාරිභෝගිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, විද්‍යාඥයන්, අලෙවිකරුවන් සහ මාධ්‍ය ඇතුළු විවිධ පාර්ශවකරුවන් ඊට සම්බන්ධ වේ. අනෙකුත් කරුණු අතර ප්‍රමිති සහ ලේබල හරහා පාරිභෝගිකයන්ට ප්‍රමාණවත් තොරතුරු සපයමින් සහ තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදනයේ නියුක්ත වෙමින් දැනුවත්භාවය ඇති කිරීම සහ තිරසාර පාරිභෝජනය සහ ජීවන රටා පිළිබඳ අධ්‍යාපනය මගින් පාරිභෝගිකයන් සමග කටයුතු කිරීම ඊට සම්බන්ධ වේ.

**අවශ්‍යතාව**

ආර්ථික සහ තිරසාර සංවර්ධනය පිළිබඳ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වත්මන් අවශ්‍යතාවය වී ඇත්තේ අදාල ආංශික ප්‍රතිපත්ති සමග අනුගතවන ති.ප.නි පිළිබඳ සර්වග්‍රාහී ජාතික ප්‍රතිපත්තියකි.

**අරමුණ සහ සංදර්භය**

මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇත්තේ සියලු  අදාළ අමාත්‍යාංශ සහ සමාජීය පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් අන්තර් ක්‍රියාකාරී ක්‍රියාදාමයක් තුළිනි. එහි අරමුණ ඉලක්කගතව ඇත්තේ, නිසි අවධානය යොමු නොකළහොත්, අපගේ ආර්ථික සංවර්ධන වැඩසටහන් ව්‍යර්ථ විය හැකි තීරණාත්මකව වැදගත්කමින් යුතු ගැටලුවලට පිළියම් යෙදීම කෙරෙහිය. සැවොම සඳහා පිරිසිදු වාතය සහ පිරිසිදු සහ ප්‍රමාණවත් ජල සැපයුමක් තිබිය යුතුය. රට සතු මිල කළ නොහැකි ස්වභාවික වන සත්ව සහ වෘක්ෂලතා උරුමය හායනය වීමට ඉඩ නොතැබිය යුතුය. නගර පවිත්‍රව තිබිය යුතු අතර සියලු නගර වැසියන් සඳහා සෞඛ්‍යමත් පරිසරයක් සැපයිය යුතුය. පරිසර දූෂණය වැළැක්වීම සඳහා වූ ක්‍රියාමාර්ග කර්මාන්ත විසින් අවබෝධ කරගෙන භාවිතයේ යෙදවිය යුතුය. දිවයිනේ සීමිත ඉඩම් සහ මිරිදිය සම්පත් ප්‍රශස්තව පරිහරණය කළ යුතුය. මෙකී ප්‍රධාන ක්ෂෙත්‍රයන් ආමන්ත්‍රණය කිරීම පිණිස වන ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන තේමා යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශන සහ අභිමතාර්ථවල අන්තර්ගත කොට ඇත.

ස්වභාවික සම්පත් කාර්යක්ෂමව සහ පලදායී ලෙස උපයෝජනය මගින් රටේ ආර්ථික සංවර්ධන මෙහෙයුම්වල තිරසාරත්වය ඉහළ නැංවීම පිණිස සඵල රාමුවක් සහ අවශ්‍ය ශක්තිය මෙම ප්‍රතිපත්තිය සපයනු ඇත.

නිෂ්පාදන පිරිවැය අඩු කිරීම,  නව සහ සම්පත් කාර්යක්ෂම නිපැයුම් නිර්මාණය, නව වෙළඳපොළ සහ රැකියා, “පසුව පිරිසිදු කිරීමේ” සඳහා වූ ක්‍රියාකාරකම්වල පිරිවැය අඩුකරන දූෂණය වැළැක්වීම, තිරසාරව ජීවත්වීම වැනි බොහෝ අවස්ථා මෙම ප්‍රතිපත්තිය පිරිනමන අතර විශේෂයෙන්ම නූතන, අඩු කාබන්, සම්පත් කාර්යක්ෂම සහ පාරිසරිකව තිරසාර තාක්ෂණවේද වෙත දැවැන්ත ඉදිරි පිම්මක් පැනීමේ අවස්ථාව උදා කරයි. එමගින්, අද්විතීය ජෛවවිවිධත්ව සම්පතක භාරකරු ලෙස එහි වටිනාකම සංරක්ෂණය කරන අතරම ලෝක වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ නංවනු ඇත.

මේ දක්වා හුදකලාවී හෝ ඛ්‍යැවී කරණයවී ඇති සියලු අදාල ආංශික ප්‍රතිපත්තිවල ති.ප.නි. අංග පොදු ආකෘතියක් යටතේ තනි ලේඛනයක් තුළට රැගෙන එන අතර ති.ප.නි. සංදර්භය තුළ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාල ජාතික ආංශික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සහ මාර්ගෝපදේශ මෙම ප්‍රතිපත්තිය සපයනු ඇත.

## 4. ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රතිපත්ති ප්‍රකාශන සහ ප්‍රතිපත්ති අභිමතාර්ථ

### 4.1 සර්වග්‍රාහී ප්‍රතිපත්ති රාමුව

සමාජ ආර්ථික සංවර්ධනය අතිශයින්ම වැදගත් වන්නාසේම ස්වභාවික සම්පත් ආරක්ෂා කිරිම, පරිසරය සුරැකීම සහ අප භූමිය වෙත ස්වභාව ධර්මය දායද කොට ඇති සම්පත් ඥාණාන්විතව භාවිතා කිරීමත් එලෙසින්ම වැදගත් වේ. ඒ සඳහා සම්පත් ආරක්ෂා කරනවා පමණක් නොව අනාගතය සඳහා ඒවා ඉවැඩි කිරීම පිණිස එම සම්පත් අද දිනයේ ප්‍රඥාවන්තව පරිහරණය කිරීම මගින් තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

ති.ප.නි පවත්නා ජාතික ආංශික ප්‍රතිපත්ති සමග සංගත වන අතර එය දැනට පවත්නා අඩු අවදානයක් ඇති මට්ටමක සිට වැඩි අවදානයක් ලැබෙන ප්‍රධාන ධාරාවේ අංගයක් ලෙස ඉහළට ඔසවා තබයි.මෙම ති.ප.නි. ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්ති, සංවර්ධන සැලසුම් සහ අන්තර්ජාතික ගිවිසුම්වලට අනුපූරක වේ.

### 4.1.1 ති.ප.නි. ප්‍රතිපත්ති මූලධර්ම

සියලු ආර්ථික අංශවල සමස්ත නිෂ්පාදනය සහ පරිභෝජනය සඳහා භාවිතා කරනු ලබන ස්වභාවික සම්පත් සහ ධූලක ද්‍රව්‍ය අවම කිරිම සහ නිෂ්පාදනයේදී උත්පාදනය වන අපද්‍රව්‍ය සහ දූෂක අවම කිරීම.

### 4.1.2 ති.ප.නි. ප්‍රතිපත්ති ප්‍රකාශන

1. පරිසර හායනය අවම කරමින් සහ අනාගත පරම්පරාවන්හි සම්පත් අවශ්‍යතා හීන කිරීමකින් තොරව ජීවිතයේ ගුණාත්මක බව ඉහළ නංවයි.
2. වත්මන් ආර්ථික ක්‍රියාකාරකම්වල ද්‍රව්‍යමය /බල ශක්ති තීව්‍රතාවය අඩුකිරීම සහ නිස්සාරණය, නිෂ්පාදනය, පරිභෝජනය සහ අපහරණයේදී ඇතිවන විමෝචන සහ අපද්‍රව්‍ය අඩු කිරීම සහ ජීවිතයේ ගුණාත්මකබව හීන කිරීමකින් තොරව වඩා අඩු බලශක්ති සහ ද්‍රව්‍යමය තීව්‍රතාවයක් සහිත භාණ්ඩ සහ සේවා කාණ්ඩයන් කරා පාරිභෝගික රටා විතැන් කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් පාරිසරික හායනයෙන් ආර්ථික වර්ධනය වෙන් කිරීම.
3. නිෂ්පාදන සහ පාරිභෝජන ක්‍රියාදාමයේ සියලු ජීවන චක්‍ර අදියරවල බලපෑම් සැලකිල්ලට ගන්නා වූ ජීවන චක්‍ර චින්තනය ආදේශ කිරීම.
4. පාරිභෝජනයේ වැඩිවීම මගින් කාර්යක්ෂමතාවයේ ප්‍රතිලාභ හීන කරන්නා වූ අනපේක්ෂිත අනිටු බලපෑම්වලින් ආරක්ෂා වීම.

### 4.1.2 ති.ප.නි. සර්වග්‍රාහී ප්‍රතිපත්ති අභාමතාර්ථ

- 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර කළමනාකරණය සහ කාර්යක්ෂම භාවිතය ළඟා කර ගනු ඇත
- 2030 වන විට ඒක පුද්ගල ආහාර නාස්තිය සිල්ලර සහ පාරිභෝගික මට්ටම්වලදී අඩකින් අඩු කරන අතර පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන සහ සැපයුම් දාම ඔස්සේ ආහාර හානි අඩු කර ගනු ඇත.
- 2020 වන විට, ගිවිසුම්ගත අන්තර්ජාතික රාමු ප්‍රකාරව රසායනික ද්‍රව්‍ය සහ සියලු අපද්‍රව්‍ය ඒවායේ ජීවන චක්‍රය මුළුල්ලෙහි ප්‍රශස්තව කළමනාකරණය කිරිම සාක්ෂාත් කර ගනු ලබන අතර මානව සෞඛ්‍යය සහ පරිසරය කෙරෙහි ඒවායේ අහිතකර බලපෑම් අවම කිරීම පිණිස ඒවා වාතයට,ජලයට සහ පසට මුදා හැරීම සැළකිය යුතු ලෙස අඩු කර ගනු ඇත.
- නිවාරණය, අවමකිරීම, ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතයට ගැනීම තුළින් 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය සැළකිය යුතු ලෙස අඩු කරනු ඇත.
- තිරසාර පරිචයන් යොදා ගැනීමට සහ වාර්තාකරනයට තිරසාරත්ව තොරතුරු ඇතුලත් කිරීමට සමාගම්, විශේෂයෙන්ම මහාපරිමාණ සහ බහුජාතික සමාගම් දිරිමත් කරනු ඇත.
- ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතාවන්ට අනුකූලව තිරසාර වන්නා වූ රාජ්‍ය ප්‍රසම්පාදන භාවිතාවන් දිරිමත් කරනු ඇත.

- 2030 වන විට, ස්වභාව ධර්මය සමග සුසංගතව, තිරසාර සංවර්ධනය සහ ජීවන රටා සඳහා අදාළ තොරතුරු සහ දැනුවත්බව සැම ජන කොට්ඨාශයක්ම සතු බව සහතික කරනු ඇත.
- පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ වඩා තිරසාර රටාවන් කරා ගමන් කිරීම පිණිස විද්‍යාත්මක සහ තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කරනු ඇත.
- රැකියා නිර්මාණය කරන සහ දේශීය සංස්කෘතිය සහ නිෂ්පාදන ප්‍රවර්ධනය කරන තිරසාර සංචාරක ව්‍යාපාරයක් සඳහා තිරසාර සංවර්ධන බලපෑම් අධීක්ෂණය පිණිස මෙවලම් සකස් කර ක්‍රියාත්මක කරනු ඇත.
- සංවර්ධනය වන රටවල අවශ්‍යතා සහ වාතාවරණයන් සැලකිල්ලට ගනිමින් සහ දිළිඳු සහ බලපෑමට ලක්වූ ප්‍රජාවන් ආරක්ෂාවන ආකාරයෙන් එම රටවල සංවර්ධනය මත සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කරමින් එම අහිතකර පාරිසරික බලපෑම් පිළිබිඹු වන පරිදි බදුකරණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ හානිකර සහනාධාර ක්‍රමයෙන් ඉවත් කිරීම මගින් වෙළඳපොළ විකෘතිවීම් ඇති නොවනසේ ෆොසිල ඉන්ධන භාවිතය අධෛර්යමත් කිරීම.

## ති.ප.නි. සඳහා ප්‍රධාන තේමා

ති.ප.නි. ප්‍රතිපත්තිය, හරිත ලංකා ක්‍රියාකාරී සැලැස්ම, ති.ප.නි. කෙරෙහි අදාළ වන්නා වූ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ජාත්‍යන්තර ගිවිසුම් සහ ජාතික ආංශික ප්‍රතිපත්ති 46 ක් (අමුණා ඇත) සමාලෝචනයෙන් පසුව, තිරසර සංවර්ධන ඉලක්ක 17ක් යටතේ ආශ්‍රිත අංශ කිහිපයක් ඒකාබද්ධ කිරීම මගින් පහත දක්වා ඇති පරිදි ප්‍රධාන මෙහෙයුම් තේමා දහයක් (10) තෝරා ගනු ලැබ ඇත.

වත්මන් තත්වය මත පදනම්ව, කෙටි සහ මධ්‍ය කාල වෙනුවෙන් ති.ප.නි. ප්‍රතිපත්තිය සඳහා ඉලක්ක ක්ෂෙත්‍ර ලෙස ප්‍රධාන මෙහෙයුම් තේමා දහයක් (10) ( මූලික පාරිසරික ගැටලු, ප්‍රමුඛතා ආර්ථික අංශ) සහ සියලු අංශ වලට අදාල වන්නාවූ ආධාරක ප්‍රතිපත්ති තුනක් (3) හඳුනාගෙන ඇත. මෙම ප්‍රතිපත්තිය ති.ප.නි අවශ්‍යතා පවත්නා අනිකුත් සැම ජාතික ප්‍රතිපත්තියකටම අන්තර්ග්‍රහණය කර මූලධාරා ගත කිරීම සහ සැම ආර්ථික අංශයකටම අදාළ කර ගැනීම අවශ්‍ය වන බැවින් මෙම ප්‍රධාන තේමා සැම වසර පහකට වරක් යාවත්කාලින කිරීම අවශ්‍යවේ.

| පාරිසරික තේමා | ආර්ථික අංශ | ආධාරක ප්‍රතිපත්ති සහ උපාය මාර්ග |
|---|---|---|
| වාතය<br>ජලය හා සනීපාරක්ෂාව<br>බලශක්තිය<br>අපද්‍රව්‍ය | කර්මාන්ත<br>ආහාර<br>ගොඩනැගිලි හා ඉදිකිරීම්<br>ප්‍රවාහනය<br>සංචාරක ව්‍යාපාරය<br>සෞඛ්‍යය | අධ්‍යාපනය හා සන්නිවේදනය<br>විද්‍යාව හා තාක්ෂණවේදය<br>රාජ්‍ය ප්‍රසම්පාදනය |

එක් එක් ප්‍රධාන තේමාව සඳහා ප්‍රතිපත්ති මූලධර්ම, ප්‍රතිපත්ති ප්‍රකාශන සහ ප්‍රතිපත්ති අභිමතාර්ථ ඉදිරිපත් කර ඇති අතර (ඇමුණුම 2 බලන්න) අදාළ සහායක අමාත්‍යාංශ සහ පාර්ශවකරුවන් සමග සමීප සහයෝගිතාවය පවත්වා ගනිමින් ප්‍රධාන නියමු අමාත්‍යාංශය විසින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා සැලසුම් සකස්කළ යුතුවේ.
මෙම ප්‍රතිපත්තිය අනුමත වී යටත් පිරිසෙයින් එක් (01) වසරක් තුළ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ.

මෙම ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී සියලුම තිරසර සංවර්ධන ඉලක්කවල අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම වැදගත් වන අතර ඒවාට අදාල ඉලක්ක ඉටුකර ගැනීම සඳහා යෝජිත සැලසුම් සමග මනා සම්බන්ධීකරණයක් තිබීම අවශ්‍ය වේ.

## 5. අදාළත්වය සහ විෂය පථය

සියලු අංශ හා සම්බන්ධ වන්නා වූ ප්‍රතිපත්තියක් වන ති.ප.නි. පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සියලුම ආකාරයේ භාණ්ඩයක් හෝ සේවාවක් පරිභෝජනය හෝ නිෂ්පාදනය කෙරෙන සියලුම අංශවලට අදාළ වේ. එය සමාජයේ කවර හෝ ඛණ්ඩයක් හෝ ස්ථරයක් හෝ කිසිදු සංවිධානයක් අත් නොහරියි. තිරසර පරිභෝජනයේ සහ නිෂ්පාදනයේ මූලික අරමුණ වනුයේ අනාගත පරම්පරාවන්හි අයිතිවාසිකම් අවදානමකට ලක් නොකොට ස්ථිරසාර මානව සංවර්ධනය සහ යහසාධනය සහතික කිරීම බැවින් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී, (මැනවින් සැලසුම්

කරන ලද (i) නියාමන සහ ප්‍රමිති (ii) ආර්ථික (iii) තොරතුරු සහ (iv) ස්වේච්ඡා ගිවිසුම් යන ආදී මෙවලම් මිශ්‍රණයක් මගින් පාලනය කිරිමට අවශ්‍ය වන්නා වූ) සියලු දෙනා අන්තර්ගත වන බව සහතික කිරීම පිණිස ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය.

## 6. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

### 6.1 පාලනය

විවිධ අමාත්‍යාංශ සහ නියෝජිතයාතන ගණනාවක සහභාගිත්වය සහිතව සියලු අංශ සම්බන්ධ කරමින් මෙම ජාතික ති.ප.නි. ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කිරීම බොහෝ දුරට රඳා පවතිනුයේ එම ආයතනවල අභයන්තර සහ අන්තර් සහයෝගය, වගකීම් බෙදාහදා ගැනිම සහ සම්පත් ඒකරාශී කිරීම මතය.මෙම ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලනික කැපවීම සහ සැබෑ සහභාගිත්වය අත්‍යාවශ්‍ය වේ. අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම උදෙසා කඩිනම් ආරම්භයක් සහ ක්‍රියාවට නැංවීමක් එය සහතික කරයි. කාර්යක්ෂමව ඉලක්ක සපුරා ගැනීම පිණිස පරිපාලන අධිකාරිය කෙරෙහි ද මෙය සාධනීය බලපෑමක් ඇති කරන අතර ඒ අනුව එය තිරස් සහ සිරස් යන දෙයාකාරව ප්‍රතිලාභ ගලායාමට අනුග්‍රහයක් දක්වයි.

එබැවින්, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය සඳහා ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ ව්‍යුහය සුපරීක්ෂා කිරීම සහ සම්බන්ධීකරණය පිණිස පාලන ව්‍යුහයක් ස්ථාපිත කරනු ඇත.

- *තිරසර සංවර්ධන ජාතික සභාව* හරහා සර්වග්‍රාහී දේශපාලන අධීක්ෂණය සිදුකරනු ඇත. ඒකාබද්ධ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේ සහ තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය ඇතුළුව (තිරසර සංවර්ධන ඉලක්ක 12 (ති.ස.ඉ.)) සමාජ සහ ආර්ථික සංවර්ධන වැඩසටහන්වල තිරසරභාවය සහතික කිරීම පිණිස සියලු ති.ස.ඉ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සහ මග පෙන්වීම සඳහා වගකීමට මෙම සභාවට බලය පවරා ඇති අතර එමගින් ති.ස.ඉ. 12 සහ අනෙකුත් ති.ස.ඉලක්ක අතර අන්තර් සම්බන්ධතාවය සුරක්ෂිත කරනු ඇත. ති.ස.ඉ 12 හි සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳ වාර්තාකරන්නා වූ පරිසරය භාර අමාත්‍යාංශය ඇතුළුව ප්‍රධාන ආර්ථික සංවර්ධන වැඩසටහන් භාරව සිටින අදාළ සියලු අමාත්‍යාංශ මෙම කමිටුව තුළ නියෝජනය වනු ඇත.

- ති.ස.ඉ 12 හි උපායමාර්ග සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය මග පෙන්වන අතර දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාමාර්ග සහ ජාතිකව නිර්ණිත දායකත්ව වැනි දැනටමත් පවතින සම්බන්ධීකරණ ව්‍යුහයන් උපකාරී කරගනු ඇත. පරිසර විෂය භාර අමාත්‍යවරයා හෝ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සභාපතිත්වය දරනු ලබන සහ තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් වූ හඳුනාගත් අංශවල අදාළ අමාත්‍යාංශ සහ නියෝජිතායතනවල නියෝජිතයන්ගෙන් සමන්විත ති.ප.නි.පිළිබඳ ජාතික කමිටුවක් ස්ථාපනය කරනු ඇත. කමිටුව කෙරෙහි ඇති අදාළත්වය අනුව වඩාත්ම සුදුසු පුද්ගලයන් නම් කිරීමට ඒ ඒ අමාත්‍යාංශ හෝ නියෝජිතායතනවල ප්‍රධානීන් දිරිමත් කරනු ඇත. ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම, ප්‍රධාන තේමා අතර සමයෝගිතාව සහ ගැටුම් වැළැක්වීම, කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ එක් එක් නියෝජිතායතන යටතේ ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය පිණිස මෙම කමිටුව මාස තුනකට වරක් රැස්වීම අපේක්ෂා කෙරේ. අවශ්‍ය සාමාජිකයන් ගණන, පරිපාලන පටිපාටි සහ සහායක ක්‍රියාමාර්ග ඇතුළුව කමිටුවේ යොමුකිරීම් අනුදේශ ප්‍රතිපත්තිය අනුමත කළ වහාම සකස් කරනු ඇත.

- යාන්ත්‍රණ 2ක් හරහා ති.ප.නි. කමිටුවට සහාය ලබා දෙනු ඇත.

  * සන්නිවේදනය, වාර්තා කිරීම, දැනුවත්බව ඇති කිරීම සහ ධාරිතා ගොඩනැංවීම ඇතුළුව කමිටුවේ සියලු මෙහෙයුම් කටයුතු පරිපාලනමය වශයෙන් හැසිරවීම සඳහා අභ්‍යන්තර ති.ප.නි. ඒකකයක් පරිසරය භාර අමාත්‍යාංශය නම් කරනු ඇත. අවශ්‍ය වූ විටදී අධ්‍යයන සහ රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය කරනු ලබන කාර්ය මණ්ඩලය සහ මුදල් ආදිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සම්පත් අමාත්‍යාංශය සම්පාදනය කරගනු ඇත.

  * නිශ්චිත තේමාත්මක අනු ක්‍රියාකාරී කණ්ඩායම් හරහා ඉල්ලීම් සිදුකළ විට කමිටුවට තාක්ෂණිකව සහාය වීම පිණිස අදාළ රජයේ නියෝජිතායතන සහ රාජ්‍ය නොවන ආයතනවල (පුද්ගලික අංශය, බුද්ධිමතුන්,

පර්යේෂණ ආයතන සහ පාරිභෝගික සංවිධාන) නියෝජිතයන්ගෙන් සමන්විත ති.ප.නි. අන්තර් නියෝජිතායතන විශේෂඥ ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපනය කරනු ඇත. එම කමිටුව වසරකට දෙවරක් රැස්වනු ඇත. කමිටුව රැස්වීමට පෙර අවශ්‍යතා පදනමින් තේමාත්මක අනු ක්‍රියාකාරී කණ්ඩායම්වල කාර්ය සටහන සැකසීම සිදුකරනු ලබනු ඇත. මෙම ක්‍රියාකාරී කණ්ඩායමේ මෙහෙයුම් වියදම් ආරම්භයේදී පරිසරය භාර අමාත්‍යාංශය විසින් ආවරණය කරනු ලබන නමුත් ක්‍රමිකව ප්‍රමාණවත් හිමිකාරිත්වයක් ලබා ගැනීම පිණිස අදාළ සියලු පාර්ශවකරුවන් අතර රාජ්‍ය-පුද්ගලික හවුල්කාරිත්වයක් හරහා සපයා ගනු ඇත.

## 6.2 සැලසුම්කරණය

සියලුම අංශ සඳහා අදාලවන සහ දිගු කාලීන දැක්මක් සහිත ති.ප.නි. සඳහා අභිමතාර්ථ පාදක ශක්තිමත් සැලසුම්කරණයක් අවශ්‍ය වනු ඇත. එමගින් අවශ්‍ය කුමක්දැයි හඳුනා ගැනීමට සහ ඒවා සාක්ෂාත් කරගැනීම පිණිස දිගු කාලීන සැලසුම් කිරීමට රාජ්‍ය සහ පුද්ගලික ක්‍රියාධරයන්ට ඉඩ සලසමින් තිරසාර සංවර්ධනය කෙරෙහි දිගු කාලීන ප්‍රවේශයන්ට සහාය දක්වනු ඇත.

සැලසුම්කරණයේ මෙම දිගුකාලීන ප්‍රවේශය, කෙටි කාලීන දේශපාලනික සහ ව්‍යාපාරික අවශ්‍යතාවයන් අනුව වෙනස් වීමට ඇති හැකියාව අවම කිරීමට උපකාරීවනු ඇත.තිරසර සංවර්ධන ප්‍රතිඵල සඳහා සැලසුම්කිරීමේදී අනිකුත් ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන්ට වෙනස්වූ ප්‍රතිපත්ති සැකැස්ම, සැලසුම්කරණය සහ පරිපාලනයක් අවශ්‍ය වනු ඇත.සෑම අරමුණක් හා උපාය මාර්ගයක් ආර්ථික, සමාජීය සහ පාරිසරික සාධක වලට අදාළව අවබෝධ කරගනු ලැබීම සහ සමාලෝචනය කරනු ලැබීම අවශ්‍ය වේ. පහත දෑ  සාක්ෂාත් කරගැනීම තීරණාත්මක වනු ඇත.

- ප්‍රතිපත්ති සංසක්තිය: සමාජීය, ආර්ථික සහ පාරිසරික සාධක තුලනය කිරීම සහ එක් ඉලක්කයක් සපුරා ගැනීමේ ප්‍රගතිය අනෙකුත් ඉලක්කවල පසුබෑමක් ඇති නොකරන බවට වග බලා ගැනීම පිණිස ඇතිවිය හැකි ගැටුම් සහ එකිනෙකට පටහැණි තත්වයන් කළමනාකරණය කිරීම;
- බහු ආංශික සැලසුම්කරණය: සාක්ෂාත් කර ගැනීමට නියමිත වෙනස් අංශ ගණනාවක් හරහා සමෝධානික ක්‍රියාමාර්ග අවශ්‍ය වන දරිද්‍රතාව සහ කාලගුණ විපර්යාස වැනි ති.ප.නි. න්‍යාය පත්‍රයේ ඇති බහු මාන සහ  සියලු අංශ හා සම්බන්ධ ගැටලුවලට පිළියම් යෙදීම.
- ආවර්ජනාත්මක සහ ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති සම්පාදනය: (i)ප්‍රතිඵල අඛණ්ඩව නිරීක්ෂණය (ii) කාර්යස්ථ පුහුණුව හා යථාවත් කිරීම (iii) නවතම තාක්ෂණය මත පදනම් වූ නව්‍යකරණය සහ (iv) වෙනස්වන තත්ත්වයන් සහිත පසුබිමකට සාපේක්ෂව කෙටි කාලීන ප්‍රමුඛතා සහ දිගු කාලීන සංවර්ධන අරමුණු තුලනයක් මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය

සංවර්ධන තත්වයන්හි වෙනස්කම්වලට ශක්තිමත් අධීක්ෂණ හා ඇගයුම් රාමුවක අන්තර්ගත කරනු ලබන, ප්‍රගතිය හා ප්‍රතිඵල නිරන්තර අධීක්ෂණය සහ සමාලෝචනය මත පදනම් වූ ප්‍රතිපත්ති සහ වැඩසටහන් අඛණ්ඩව ප්‍රතිඇගයුමට සහ අනුවර්තනයට ප්‍රතිචාරාත්මකව, වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් හරහා 4 වන කොටස යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශන සහ ප්‍රතිපත්ති ඉලක්ක විස්තරාත්මකව දක්වනු ඇත.

## 6.3 අධීක්ෂණය සහ ඇගයීම

ජාතික ති.ප.නි. ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු පිණිස, පවත්නා දර්ශක කට්ටල සහ සකස් කරන ලබන ති.ප.නි. දිශානතික ඉලක්ක මත පදනම්ව දර්ශක රාමුවක්  ති.ප.නි. අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරනු ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව ඒ සඳහා මූලිකත්වය ගෙන මග පෙන්වනු ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටෙහි සංවර්ධන සහ අනෙකුත් සමාජ ආර්ථික ක්‍රියාකාරකම් සැලසුම්කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම අවශ්‍ය කරනු ලබන අදාළ, විශ්වස්‍ය සහ යාවත්කාලීන සංඛ්‍යාත්මක තොරතුරු එක්රැස් කර, සම්පාදනය කොට ප්‍රචාරණය කරනු ලබන අතර එහෙයින් සියලු ජාතික සංගණන සහ සමීක්ෂණ පැවැත්වීමේ සහ පරිපාලන වාර්තා භාවිතා කරමින් නිල සංඛ්‍යාලේඛන උත්පාදනය කිරීමේ වගකීම එයට පවරනු ඇත. ස්ථාපිත ප්‍රමුඛතා සහ ඉලක්කයන්හි ප්‍රගතිය නිරීක්ෂණය හරහා ති.ප.නි. ප්‍රගතියේ සාර්ථකත්වය ඇගයීමේ වඩාත්ම සඵල ක්‍රමවේදයක් වනුයේ දර්ශක පාදක ඇගයීම සහ වාර්තා කිරීමයි. ති.ප.නි. දර්ශක, දරිද්‍රතාව අඩුකිරීම ඇතුළුව පාරිසරික සහ තිරසාර සංවර්ධනය පිළිබඳ වඩා පුළුල් දර්ශක මාලාවකට වෙන් කළ නොහැකි සේ බැඳී පවතී. මෙම දර්ශක, පරිභෝජනය සහ නිෂ්පාදනය

පිළිබඳ වඩා තිරසාර රටා කරා ප්‍රගතිය මණින්නා වූ දර්ශක සකස් කිරීම සඳහා විවිධ අමාත්‍යාංශවලට මාර්ගෝපදේශ සපයනු ඇත. ති.ප.නි. වැඩසටහනක් අධීක්ෂණය කිරීම නොකඩවා සිදුවන ක්‍රියාවලියක් වන අතර වඩා හොඳ ක්‍රමවේද සහ දත්ත භාවිතය සඳහා ඇති ක්‍රමයන් විකාසය වනු ඇත.

## 7. පාරිභාෂික ශබ්ද මාලාව

මෙම පාරිභාෂික ශබ්ද මාලාවේ අරමුණ වනුයේ මෙම ප්‍රතිපත්තිය සකස් කරනු ලැබූ සංදර්භයෙහි ඇතැම් පාරිභාෂික යෙදුම් පිළිබඳ සතුටුදායක අවබෝධයක් මෙම ප්‍රතිපත්ති ලේඛනය පරිශීලනය කරන්නන්ට ලබා දීමට සහාය වීමයි. වෙනස් සංදර්භයන් සහ තත්ත්වයන් තුළ එම පාරිභාෂික යෙදුම්වල අර්ථ නිරූපණය වෙනස් විය හැකි බව සටහන් කිරීම වැදගත් වේ.

**'අ' කොටස:**

**ප්‍රතිපත්ති මූලධර්ම:** ප්‍රතිපත්ති මූලධර්ම යනු ප්‍රතිපත්තියක් පැවතිය යුත්තේ කුමකටදැයි යන්න සඳහා වන හේතූන් වේ. ප්‍රතිපත්තියක් පවතිනුයේ යම් කිසි කාර්යයක් සඳහා වන අතර එය ඒ සඳහා පදනම වන්නා වූ මූලධර්ම ආකාරයෙන් එය ප්‍රකාශ කරනු ලැබේ. රජයක් ප්‍රතිපත්තියක් සකස් කරන්නේ කුමකට ද යන්න සහ එම ප්‍රතිපත්තියේ අපේක්ෂිත බලපෑම හෝ ප්‍රතිඵලය කුමක් විය යුතු ද යන්න ප්‍රතිපත්ති මූලධර්ම සංක්ෂිප්තව දක්වයි. ප්‍රතිපත්ති මූලධර්ම ආයතනික හෝ උපාය මාර්ගික සැලසුම්වල දැක්ම පිළිබඳ ප්‍රකාශනයට සමාන වේ.

**ප්‍රතිපත්ති ප්‍රකාශන:** ප්‍රතිපත්ති ප්‍රකාශන යනු රජයේ ස්ථාවරය පිළිබඳ අතිශයින් වැදගත් ප්‍රකාශන වේ. ප්‍රතිපත්ති ප්‍රකාශන හරහා ප්‍රතිපත්තියේ අභිප්‍රාය සරල සහ කෙටි ප්‍රකාශන ස්වරූපයෙන් ප්‍රකාශ කරනු ලැබේ. එබැවින්, ප්‍රතිපත්ති ප්‍රකාශන යම් නිශ්චිත මාතෘකාවක් හෝ මාතෘකා පිළිබඳ ඍජු ප්‍රකාශනයක් හෝ ප්‍රකාශයක් කිරීම පිණිස යොදා ගනු ලැබේ. අඛණ්ඩ සංශෝධනයන්ට ලක් නොකොට දීර්ඝ කාලයක් පුරා පැවැතීමට ප්‍රතිපත්ති ප්‍රකාශනයන්ට හැකි විය යුතුය. ඒ අතරම, අනාගතයේ අපේක්ෂා නොකළ තත්ත්වයන් සඳහා නම්‍යශීලී වීම සහ හැඩ ගැසීම සඳහා ඉඩ දීමට තරම් ඒවා සීමාවන්ගෙන් තොරවිය යුතුය. පොදුවේ ගත් කළ, ගනු ලැබීමට නියමිත ක්‍රියාමාර්ග පාලනය කිරීම හෝ ඒ සඳහා මග පෙන්වීම ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් සිදු කරයි. යමක් කළ යුත්තේ කෙසේද යන්න නොව කළ යුත්තේ කුමක්ද යන්න ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහන් කරයි. ප්‍රතිපත්ති මූලධර්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන අතර පැහැදිළි වෙනසක් තිබේ. ශක්තිමත් විද්‍යාත්මක සාක්ෂි හෝ දත්ත නොමැත්තේ වුවද ක්‍රියාමාර්ගයේ හෝ චින්තනයේ "පදනම හෝ විශ්වාසය" ප්‍රතිපත්ති මූලධර්ම වේ. මෙම ප්‍රතිපත්ති මූලධර්ම කෙරෙහි විශ්වාසය තබා ප්‍රතිපත්ති සම්පාදකයන් තමන් කැපවෙනුයේ කුමක් කිරීමට ද යන්න සඳහන් කරයි. එහෙයින් ප්‍රතිපත්ති ප්‍රකාශන යනු "අපට අවශ්‍ය වන්නේ මෙයයි යන්න ප්‍රේක්ෂකයන්ට නිවේදනය කරනු ලබන පැහැදිළි පණිවුඩ වේ."

**ප්‍රතිපත්ති අභිමතාර්ථ:** ප්‍රතිපත්තියකට "අභිමතාර්ථ" තිබේ. මෙම අභිමතාර්ථ අභිප්‍රේත ප්‍රතිඵල පරාසය හෝ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට නියමිත කුමක්ද යන්න විස්තර කරයි. ප්‍රතිපත්ති අභිමතාර්ථයක් යනු අභිප්‍රාය පිළිබඳ පුළුල් ප්‍රකාශයක් වන අතර එය ක්‍රියාමාර්ග සඳහා මාර්ගෝපදේශ සපයයි.

**ප්‍රතිපත්ති අරමුණු:** අභිමතාර්ථ සහ අරමුණු යනු එක සමාන නොවේ. අරමුණු සකස් කිරීමේදී 'මැනිය හැකි බව' සැමවිටම වැදගත් මූලධර්මයක් සේ සලකනු ලැබේ. අරමුණු සාමාන්‍යයෙන් "මෙහෙයුම් ඒකක" එකකට හෝ වැඩි ගණනකට සම්බන්ධ අතර ස්වභාවයෙන්ම "කෙටි කාලීන" වේ. මැනිය හැකි අරමුණු නොමැති ප්‍රතිපත්තියක් ලිවීම සිදුකළ හැකි අතර එය රටේ අවශ්‍යතා සපුරාලනු පිණිස වනු ඇත. ප්‍රතිපත්තියේ දීර්ඝකාලීන බව සහතික කිරීම සඳහා අභිමතාර්ථ පමණක් වුවද ප්‍රමාණවත් වේ. ප්‍රතිපත්ති අරමුණු යනු ප්‍රතිපත්තියට අනුකූලවීම පිණිස පාඨකයන් කුමක් කළ යුතුද යන්න අවබෝධ කර ගැනීමට ඔවුනට උපකාර වන ප්‍රතිපත්තිය තුළ අන්තර් ගත ලිඛිත මාර්ගෝපදේශ වේ. මෙම ලිඛිත මාර්ගෝපදේශ උචිත වදන් යොදා සඵල ආකාරයෙන් නිශ්චිත තේරුමක් ඇතිව පැහැදිළිව ලිවිය යුතුය.

**'ආ' කොටස:**

**සුපිරිසිදු නිෂ්පාදනය:** සමස්ත කාර්යක්ෂතමතාව ඉහළ නැංවීම සහ මිනිසාට සහ පරිසරයට පවතින අවදානම් අඩුකිරීම පිණිස ක්‍රියාවලි , භාණ්ඩ සහ සේවාවන්ට ඒකාබද්ධ නිවාරක පාරිසරික උපායමාර්ගයක් අඛණ්ඩව යොදා ගැනීම. ඕනෑම කර්මාන්තයක යොදා ගනු ලබන ක්‍රියාදාම, භාණ්ඩ සඳහා සහ සමාජයට සපයනු ලබන විවිධ සේවාවන්ට සුපිරිසිදු නිෂ්පාදනය ආදේශ කළ හැකිය.

**වියැදීම:** වියැදිම යන්නෙන් අදහස් වනුයේ (1) දළ ජාතික නිෂ්පාදිතය හෝ මානව සංවර්ධන දර්ශකය වැනි ආර්ථික විචල්‍යයන් සහ (2) සම්පත් භාවිතය සහ පාරිසරික දර්ශක වැනි පාරිසරික විචල්‍යයන් අතර සබඳතාවයයි. ආර්ථික වර්ධනය සම්පත් භාවිතයෙන් සහ පාරිසරික බලපෑමෙන් වියැදීම අතර වෙනසක් තිබේ. සම්පත් වියැදීම යනු ආර්ථික ක්‍රියාකාරකම් ඒකකයක් සඳහා සම්පත් භාවිතයේ ප්‍රමාණය අඩු කිරීමයි. මෙම "අද්‍රව්‍යකරණය" එම ආර්ථික නිමැවුම සඳහා අඩුවෙන් ද්‍රව්‍ය, බලශක්තිය, ජලය සහ ඉඩම් සම්පත් භාවිතා කිරීම මත පදනම් වේ. සම්පත් වියැදීම සම්පත් භාවිතා කරනු ලබන කාර්යක්ෂමතාව ඉහළ යාමට හේතු වන අතර සම්පත් යෙදවුමට සාපේක්ෂව ආර්ථික නිමැවුම ඉහළ යන විටදී එය පෙන්නුම් කරනු ලබයි.

**පරිසරකාමී කාර්යක්ෂමතාව:** ජීවන චක්‍රය පුරා පාරිසරික බලපෑම සහ සම්පත් තීව්‍රතාව යටත් පිරිසෙයින් පෘතුවියේ ඇස්තමේන්තුගත ඉසුලුම් ධාරිතාවට අනුකූල මට්ටමකට අනුක්‍රමිකව අඩුකරමින්, මානව අවශ්‍යතා සපුරාලන සහ ජීවිතයේ ගුණාත්මකභාවය ඇති කරන තරඟකාරීව මිල කරන ලද භාණ්ඩ සහ සේවා සැපයුම මගින් පරිසරකාමී කාර්යක්ෂමතාව සාක්ෂාත් කරගැනීම.

**ජීවන චක්‍ර ඇගයුම:** ජීවන චක්‍ර ඇගයුම යනු නිෂ්පාදන සහ සේවාවන්හි ජීවන චක්‍රය පුරා ඒවායේ පාරිසරික සහ සමාජීය කාර්යසාධනය ඇගයීම පිණිස වන මෙවලමකි. පාරිසරික ජීවන චක්‍ර ඇගයුම යටතේ, සම්පත් (බලශක්තිය ඇතුළුව) නිස්සාරණය සහ පරිභෝජනය මෙන්ම වාතයට, ජලයට සහ පසට මුදා හැරීම ජීවන චක්‍රයේ සියලු අදියරවලදී ප්‍රමාණනය කරනු ලැබේ. ඉන් අනතුරුව, වැදගත් පාරිසරික බලපෑම් කාණ්ඩයන් කෙරෙහි ඒවායේ විභව්‍ය දායකත්වය තක්සේරු කරනු ලැබේ. දේශගුණික විපර්යාස, ධූලකතාව, පාරිසරික පද්ධති හානිවීම සහ සම්පත් පදනම හායනය වීම ඒවාට ඇතුලත් වේ.

**ජීවන චක්‍ර චින්තනය**: ජීවන චක්‍ර චින්තනය භාවිතය පමණක් වන සාම්ප්‍රදායික යොමුව පුළුල් කරන අතර ආරම්භයේ සිට අවසානය දක්වා ( එනම් සම්පත් නිස්සාරණයේ සිට නිෂ්පාදනය ඔස්සේ නිෂ්පාදනය භාවිතයේ සිට අපහරණය කරනු ලැබූ නිපැයුමේ අවසන් පිරිසැකසුම දක්වා) නිපැයුමේ සමස්ත ජීවන චක්‍රය පුරාම විවිධ අංග අන්තර්ගත කරයි.

**දූෂකයා දඩුවම් විඳිමේ ප්‍රතිපත්තිය-** දූෂකයා දඩුවම් විඳිමේ ප්‍රතිපත්තිය යනු දූෂණයේ පිරිවැය දූෂණය ඇති කරන්නවුන් විසින් දැරීම අවශ්‍ය කරන්නා වූ පාරිසරික ප්‍රතිපත්තියකි. එහි මූලික ස්වරූපයේදී, දූෂකයා දඩුවම් විඳිමේ ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ දූෂණය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ පිරිවැය වෙන් කරනු ලැබිය යුත්තේ කෙසේද යන්න නිශ්චය කිරිමයි. එහි ඉලක්කය වනුයේ භාණ්ඩ සහ සේවාවන්හි මිල, නිෂ්පාදන පිරිවැය පූර්ණව පිළිබිඹු කිරීමට හැකි වන සේ එහි ආර්ථික ක්‍රියාකාරකම්වල පාරිසරික බාහිරත්වයන් අභ්‍යන්තරකරණය කිරිමයි. වත්මනෙහි මෙම ප්‍රතිපත්තිය අන්තර්ජාතික පරිසර නීතියේ පොදුවේ පිළිගත් මූලධර්මයකි.

**තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය:** තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය යනු "අනාගත පරම්පරාවන්ගේ අවශ්‍යතා අවදානමකට ලක් නොවන ලෙසට සේවාවේ හෝ නිෂ්පාදනයේ ජීවන චක්‍රය පුරා ස්වභාවික සම්පත් සහ ධූලක ද්‍රව්‍ය භාවිතය මෙන්ම අපද්‍රව්‍ය සහ දූෂක විමෝචන අවම කරමින් මූලික අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර දක්වන්නා වූ සහ වඩා යහපත් ජීවන ගුණාත්මකබවක් ඇති කරන්නා වූ සේවා සහ ආශ්‍රිත නිෂ්පාදන භාවිතයයි".

**තිරසර ප්‍රසම්පාදනය:** තිරසාර ප්‍රසම්පාදනය යනු පරිසරයට සිදුවන හානිය අවම කරමින්, ප්‍රසම්පාදන ආයතනයට පමණක් නොව සමාජයට සහ ආර්ථිකයට ප්‍රතිලාබ උත්පාදනය කිරිම ප්‍රකාරව සමස්ත ආයු කාල පදනමක් මත නිසි වටිනාකමක් සාක්ෂාත් කරගන්නා වූ ආකාරයකින් භාණ්ඩ, සේවා, වැඩ සහ උපයෝගිතා සඳහා අවශ්‍යතා සංවිධාන සපුරාගන්නා වූ ක්‍රියාදාමයකි. තිරසර සංවර්ධනයේ ප්‍රධාන සංරචක තුන වන ආර්ථිකය, සමාජය සහ පරිසරය අතර උචිත සමබරතාවක් සාක්ෂාත් කරගැනීමට තිරසර ප්‍රසම්පාදනය ප්‍රයත්න දරයි. ආර්ථික සාධකයන්ට, යහපත් මූල්‍ය කළමනාකරණයට අනුකූලව අත්කර ගැනීම, නඩත්තුව, මෙහෙයුම් සහ ආයු කාලය අවසානයේ කළමනාකරණ පිරිවැය (අපද්‍රව්‍ය අපහරණය ඇතුළුව) වැනි භාණ්ඩ හා සේවාවන්හි සමස්ත ආයු කාලය පුරා ඒවායේ පිරිවැය ඇතුලත් වේ, සමාජීය සාධකයන්ට සමාජ යුක්තිය සහ සාධාරණත්වය, සුරක්ෂිතතාව සහ ආරක්ෂාව, මානව හිමිකම් සහ රැකියා නියුක්ති තත්ත්වයන් ඇතුලත් වේ. පාරිසරික සාධකයන්ට සමස්ත නිෂ්පාදන චක්‍රය පුරා වාතය, භූමිය සහ ජලය වෙත විමෝචන, දේශගුණික වෙනස්කම්, ජෛව විවිධත්වය, ස්වභාවික සම්පත් භාවිතය සහ ජල හිඟය ඇතුලත් වේ.

**ඇමුණුම 1: ති.ප.නි. හි අන්තර් ආංශික ස්වභාවයට අදාළව සියලු ති.ස.ඉ පිළිබඳ දළ විශ්ලේෂණය**

2014 වසරේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් තිරසර සංවර්ධන ඉලක්ක මාලාවක් හඳුන්වා දුනි. සහශ්‍ර සංවර්ධන ඉලක්ක වෙනුවට 2015-2030 කාල සීමාව වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාව සඳහා නිර්දේශන ඉලක්ක ලෙස මෙම ති.ස.ඉ හඳුන්වා දුනි. මෙම ඉලක්ක ඒවායේ පූර්වගාමී සහසර ඉලක්ක වලට වඩා බෙහෙවින් පුළුල් කරුණු ගණනාවක් ආවරණය කරන බැවින් හා ඒවා මුළු විශ්වයටම බලපෑමට අරමුණු කරන බැවින් - එනම් සංවර්ධන වෙමින් පවතින රටවලට පමණක් නොව සියලු රටවල් වලටත් අදාළ බැවින් සහ 1992 පෘථිවි සමුළුවේ සිට ජාත්‍යන්තර ප්‍රජාව අපේක්ෂාකල තිරසර සංවර්ධනය වෙත සංක්‍රාන්තියක් සඳහා මං සලකුණු ලෙස කටයුතු කිරීමට සිදුව ඇති බැවින් මෙසේ නව ඉලක්ක මාලාවක් සකස් කිරීම අභියෝගයක් ලෙස පොදුවේ දකින ලදී.

ති.ස.ඉලක්කයන්හි බහුවිධ අභිමතාර්ථ සහ අංශ පිළිබඳව සඳහන් කර ඇති අරමුණු පැවැතීම, විශේෂයෙන්ම අන්තර්ජාතික සංවර්ධන නියෝජිතායතන මට්ටමේදී විවිධ අංශ හරහා සමෝධානය සහ සහ ප්‍රතිපත්ති ගැලපීම සඳහා පහසුකම් සැපයීමට ඉඩ ඇත. අරමුණු ඔස්සේ අභිමතාර්ථ අතර එවැනි බන්ධන, සංවර්ධන ආයතන තුළ ශක්තිමත් ආංශික ආරක්ෂාවක් නොතිබීම නිසා මීන් පෙර සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපහසුවූ ති.ප.නි වැනි මානයන් සැබෑ ලෙස මූලධාරා ගත කිරීම සඳහා ද පහසුකම් සැපයේ.

පහත දැක්වෙන න්‍යාසයේ, ති.ස.ඉ. 12 නිශ්චිතව ආමන්ත්‍රණය කොට ඇති ති.ප.නි සහ අනෙකුත් ඉලක්ක අතර සම්බන්ධතා පෙන්නුම් කරයි. උදාහරණයක් ලෙස, ති.ප.නි. සහ ජලය පිළිබඳව වන ති.ස.ඉ. 6 අතර සම්බන්ධතා ජල ඉලක්ක: අභිමතාර්ථ අරමුණු 2 ක් ලෙස 6.3 යටතේ සපයා ඇත. එනම් *"දූෂණය අඩු කිරීම, උපද්‍රවකාරී රසායනික සහ ද්‍රව්‍ය බැහැර කිරීම තුරන් කිරීම සහ නිදහස් කිරීම අවම කිරීම, පිරියම් නොකරන ලද අප ජල අඩකින් අඩුකිරීම සහ ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂිත නැවත භාවිතය වැඩිකිරීම මගින් ජලයේ ගුණාත්මය ගෝලීයව x% කින් වැඩි දියුණු කිරීම"* සහ අරමුණ 6.4 *"2030 වන විට, සියලු අංශ තුළ ජල පරිභෝජන කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම සහ ජල හිඟයෙන් පීඩා විඳින ජන සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩුකිරීම"*. එසේම අරමුණ 8.4 හරහා වර්ධනය සහ රැකියා නියුක්තිය පිළිබඳ ති.ස.ඉ.8 සමග ති.ප.නි. සම්බන්ධ කරනු ලැබ ඇත, පරිභෝජනයේ සහ නිෂ්පාදනයේ ගෝලීය සම්පත් කාර්යක්ෂමතාව 2030 වන විට අනුක්‍රමිකව වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය වන රටවල් නායකත්වය යටතේ තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළබඳ 10-අවුරුදු වැඩසටහන් රාමුව ප්‍රකාරව ආර්ථික වර්ධනය පරිසර හායනයෙන් වෙන් කිරීමට උත්සාහ කිරීම". මෙයින් අදහස් වනුයේ ති.ප.නි. අදාළව අවධානයට යොමුව ඇති කරුණු අනෙකුත් අභිමතාර්ථවලට අයත් අරමුණුවදී සැලකිල්ලට ගෙන ඇති බවයි.

| | අභිමතාර්ථ | උප අභිමතාර්ථ | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | දරිද්‍රතාව | 1.1 | 1.2 | 1.3 | 1.4 | 1.5 | 1.a | 1.b | | | | | | | | | | | | |
| 2 | ආහාර | 2.1 | 2.2 | 2.3 | 2.4 | 2.5 | 2.a | 2.b | 2.c | | | | | | | | | | | |
| 3 | සෞඛ්‍යය | 3.1 | 3.2 | 3.3 | 3.4 | 3.5 | 3.6 | 3.7 | 3.8 | 3.9 | 3.a | 3.b | 3.c | 3.d | | | | | | |
| 4 | අධ්‍යාපනය | 4.1 | 4.2 | 4.3 | 4.4. | 4.5 | 4.6 | 4.7 | 4.a | 4.b | 4.c | | | | | | | | | |
| 5 | ස්ත්‍රීපුරුෂ සමාජභාවය | 5.1 | 5.2 | 5.3 | 5.4 | 5.5 | 5.6 | 5.a | 5.b | 5.c | | | | | | | | | | |
| 6 | ජලය | 6.1 | 6.2 | 6.3 | 6.4 | 6.5 | 6.6 | 6.a | 6.b | | | | | | | | | | | |
| 7 | බලශක්තිය | 7.1 | 7.2 | 7.3 | 7.a | 7.b | | | | | | | | | | | | | | |
| 8 | ආර්ථිකය | 8.1 | 8.2 | 8.3 | 8.4 | 8.5 | 8.6 | 8.7 | 8.8 | 8.9 | 8.1 | 8.a | 8.b | 8.c | | | | | | |
| 9 | කර්මාන්ත | 9.1 | 9.2 | 9.3 | 9.4 | 9.5 | 9.a | 9.b | 9.c | | | | | | | | | | | |
| 10 | අසමානතාව | 10.1 | 10.2 | 10.3 | 10.4 | 10.5 | 10.6 | 10.7 | 10.a | 10.b | 10.c | | | | | | | | | |
| 11 | නගර | 11.1 | 11.2 | 11.3 | 11.4 | 11.5 | 11.6 | 11.7 | 11.a | 11.b | 11.c | | | | | | | | | |
| 12 | ති.ප.නි. | 12.1 | 12.2 | 12.3 | 12.4 | 12.5 | 12.6 | 12.7 | 12.8 | 12.a | 12.b | 12.c | | | | | | | | |
| 13 | දේශගුණික විපර්යාස | 13.1 | 13.2 | 13.3 | 13.a | 13.b | | | | | | | | | | | | | | |
| 14 | සමුද්‍රීය | 14.1 | 14.2 | 14.3 | 14.4 | 14.5 | 14.6 | 14.7 | 14.a | 14.b | 14.c | | | | | | | | | |
| 15 | පාරිසරික පද්ධති | 15.1 | 15.2 | 15.3 | 15.4 | 15.5 | 15.6 | 15.7 | 15.8 | 15.9 | 15.a | 15.b | | | | | | | | |
| 16 | අන්තර්කරණ | 16.1 | 16.2 | 16.3 | 16.4 | 16.5 | 16.6 | 16.7 | 16.8 | 16.9 | 16.1 | 16.a | | | | | | | | |
| 17 | ගෝලීය | 17.1 | 17.2 | 17.3 | 17.4 | 17.5 | 17.6 | 17.7 | 17.8 | 17.9 | 17.10 | 17.11 | 17.12 | 17.13 | 17.14 | 17.15 | 17.16 | 17.17 | 17.18 | 17.19 |

## ඇමුණුම 2: ආශ්‍රිත ප්‍රතිපත්ති ලැයිස්තුව

1. වසර 2000දී පිරිසිදු වාතය සඳහා උපායමාර්ගය සහ ක්‍රියාකාරී සැලැස්ම (1992)
2. ජාතික පානීය ජල ප්‍රතිපත්තිය
3. ශ්‍රී ලංකාවේ ජල සම්පත්, ඒවායේ පෝෂක ප්‍රදේශ සහ රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය. (2014)
4. ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය සහ ආයතනික සැකැස්ම (2000)
5. ග්‍රාමීය ජල සැපයුම් සම්පාදනය සහ සනීපාරක්ෂක අංශය සඳහා ජාතික ප්‍රතිපත්තිය
6. වැසි ජලය රැස්කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2005)
7. ශ්‍රී ලංකා ජාතික පෝෂණ ප්‍රතිපත්තිය (2010)
8. ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය
9. කෘෂිකාර්මික අංශය සඳහා සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය
10. ජාතික ජෛවආරක්ෂණ ප්‍රතිපත්තිය (2005)
11. ජාතික ජෛව තාක්ෂණ ප්‍රතිපත්තිය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව
12. ජාතික ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්තිය (2006)
13. ධීවර අංශය සංවර්ධනය සඳහා මැද කාලීන ප්‍රතිපත්ති රාමුව (2012)
14. ධීවර අංශය සඳහා සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය
15. ජාතික සෞඛ්‍යය ප්‍රවර්ධන ප්‍රතිපත්තිය (කෙටුම්පත)
16. ශ්‍රී ලංකා සෞඛ්‍ය තොරතුරු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
17. සෞඛ්‍ය අංශය සඳහා සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය (2007)
18. ජාතික නිවාස ප්‍රතිපත්තිය (කෙටුම්පත)
19. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා
20. ශ්‍රී ලංකාව සඳහා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග (කෙටුම්පත)
21. ශ්‍රී ලංකාව සඳහා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග (2008)
22. ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය
23. ජාතික ජලාධාර කළමනාකරණ ප්‍රතිපත්තිය
24. තෙත්බිම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය
25. ජාතික වනවිද්‍යා ප්‍රතිපත්තිය
26. ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ සඳහා ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය
27. ජාතික වනජීවී ප්‍රතිපත්තිය
28. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය
29. ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය සහ සැලැස්ම
30. ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය සහ සැලැස්ම - 2030
31. ජාතික විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්තිය
32. රාජ්‍ය පාලනයේදී තො.ස.තා. භාවිතය සඳහා ප්‍රතිපත්ති සහ පරිපාටි (ඊ-රාජ්‍ය ප්‍රතිපත්තිය)
33. ශ්‍රී ලංකා ජාතික තරුණ ප්‍රතිපත්තිය
34. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ජාතික ප්‍රතිපත්තිය (කෙටුම්පත)
35. සුනිසි රැකියා සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුව
36. ඉහළ දූෂණ කර්මාන්ත ස්ථානගත කිරීම
37. ජාතික වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ජාතික ප්‍රතිපත්තිය (2014)
38. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික උපාය මාර්ගය
39. ජාතික වැවිලි කර්මාන්ත ප්‍රතිපත්ති රාමුව
40. සංචාරක අංශය සඳහා සුපිරිසිදු නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගය
41. මාධ්‍ය ප්‍රතිපත්තිය
42. ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය (2009)
43. ආපදා කළමනාකරණ ජාතික ප්‍රතිපත්තිය (2013)
44. ශ්‍රී ලංකා දේශගුණික විපර්යාස ජාතික ප්‍රතිපත්තිය (2012)
45. ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස අනුවර්තන උපායමාර්ගය
46. ඉදිකිරීම් සඳහා සම්පතක් ලෙස වැලි පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය

ඇමුණුම 3 : ප්‍රධාන තේමා අනුව මූලධර්ම, ප්‍රකාශන සහ අභිමතාර්ථ

## 1. වාතය[4]

### 1.1.1 ප්‍රතිපත්ති මූලධර්ම

නිරෝගී ජාතියක් සඳහා සුපිරිසිදු වාතය

### 1.1.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සියලු ආර්ථික ක්‍රියාකාරකම් සඳහා විමෝචන අඩුකිරීම් සහ පරිසර දූෂණ පාලන ක්‍රියාමාර්ග හඳුන්වා දෙන්න, උදා. ගොඩනැගිලි සහ ඉදිකිරීම්, ප්‍රවාහනය, කර්මාන්ත, බලශක්ති උත්පාදනය, ඉඩම් පරිහරණය, කෘෂිකර්මාන්තය, පශු සම්පත්, අපද්‍රව්‍ය සහ ගෘහ (ගෘහස්ථ වායු දූෂණය)
2. පරිසරික වාත තත්ත්ව නිරීක්ෂණය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න.
3. වායු දූෂණයේ පාරිසරික බලපෑම් (සෞඛ්‍ය ඇතුලුව) සහ නිවාරණයේ යහපත් පරිචයන් (අහිතකර ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම, පරිභෝජන චර්යා වෙනස් කිරීම) පිළිබඳව මහජනයා අතර දැනුවත්බව ඇති කරන්න.

### 1.1.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. අදාළ සෞඛ්‍ය දර්ශක සමගින් වායු තත්ත්ව ප්‍රමිති යොදා ගැනීම අරඹයි.
2. පරිසරික වාත තත්ත්ව නිරීක්ෂණය සඳහා ක්‍රමවේදයක් 2020 වන විට රටේ සියලු ප්‍රධාන නගරවල ස්ථාපිත කරනු ලබයි.
3. සුපිරිසිදු වාතය සහතික කිරීම පිණිස ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවේ යොදවයි.
4. ගෘහස්ත සහ එළිමහන සඳහා ඉහළ වායු තත්ත්ව ප්‍රමිති, පීඩන උපකරණ කාන්දුවීම් සහ මූලාශ්‍ර විමෝචන සඳහා වඩා යහපත් නියාමන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලබයි.
5. වාහන විමෝචන සඳහා ඉතා ඉහළ ප්‍රමිති හඳුන්වා දෙනු ලබයි, පරීක්ෂණ සහ අධීක්ෂණ යටිතල පහසුකම් උත්ශ්‍රේණි කෙරේ.
6. වායු දූෂණය අඩුකිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයට නියාමන යාන්ත්‍රණ හඳුන්වා දෙනු ලබයි.
7. වායු දූෂණය ඇති කරන වාහන සඳහා පාරිසරිකව සහ සංස්කෘතිකව සංවේදී ප්‍රදේශ සීමාන්විත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි.
8. අදාළ සහිත පාර්ශව සඳහා වායු තත්ත්වයට අදාළ දත්ත ලබා දීම සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ අයිතිය ස්ථාපිත කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** පරිසරය භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** ප්‍රවාහනය, සිවිල් ගුවන් සේවා, කර්මාන්ත, විදුලිබල හා බලශක්තිය, සෞඛ්‍යය, පළාත් සභා සහ පළාත් පාලන, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය, මුදල්, ජාතික ප්‍රතිපත්ති බාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## 2. ජලය සහ සෞඛ්‍යාරක්ෂාව[5]

### 2.1 ප්‍රතිපත්ති මූලධර්මය

ජලය සහ සෞඛ්‍ය පිළිබඳ සවිඥානක ජාතියක්

---

[4] ති.ස.ඉ.13 (දේශගුණික විපර්යාස) සම්බන්ධ සැලසුම් සමග අන්තර්බන්ධන සහ සියලු ආර්ථික අංශ සඳහා අදාළ වේ.
[5] ති.ස.ඉ.6 (ජලය) සහ 14 (සමුද්‍රීය) සම්බන්ධ සැලසුම් සමග අන්තර්බන්ධන සහ සියලු ආර්ථික අංශ සඳහා අදාළ වේ.

## 2.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සැවොම සඳහා සාධාරණ ජල බෙදීමක් සහ ක්‍රියාවට නැංවීම ශක්තිමත් කිරීම සඳහා සමෝධානික ජල සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරන්න.
2. ජල පරිභෝජනයේ සෑම මට්ටමකදීම සංරක්ෂණ, ප්‍රති-උපයෝගී සහ ප්‍රතිචක්‍රීකරණ පරිචයන් ඒකාබද්ධ කරන්න.
3. ජල සුරක්ෂිතතාව සහ ආරක්ෂාව පිළිබඳ සැලසුම් ප්‍රවර්ධනය කරන්න, ශක්තිමත් කරන්න.
4. ප්‍රධාන ගංගාවන්හි ජල ගුණත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම ප්‍රවර්ධනය කරන්න.
5. ජලය සුරකින තාක්ෂණවේද සහ බලශක්ති කාර්යක්ෂම ජල භාවිතයන් ප්‍රවර්ධනය කරන්න.
6. වැසි ජලය රැස්කිරීම සහ භූ ජලධර පුනරාරෝපණය ප්‍රවර්ධනය කරන්න.
7. බෝතල් කළ ජලය පිරිසැකසුම, බෙදාහැරීම සහ පරිභෝජනය, ආවේක්ෂණය සහ අධීක්ෂණය ශක්තිමත් කරන්න.
8. වඩා යහපත් සෞඛ්‍යයක් සහ පාරිසරික අවශ්‍යතා වෙනුවෙන් තිරසර ජල උපයෝජනය සඳහා චර්යාත්මක සහ ජීවන පැවැතුම් වෙනස්කම් දිරිමත් කරන්න.
9. සුරක්ෂිතව කළමනාකරනය කරනු ලබන සෞඛ්‍යාරක්ෂාව දිරි ගන්වන්න.
10. ජල සහ සෞඛ්‍යාරක්ෂාව තුලට දේශගුණය සහ ආපදා ප්‍රත්‍යාස්ථිතිය මූලධාරා ගත කරන්න.

## 2.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. ඒක පුද්ගල ජල භාවිතය අඩුවීම ඇතුලුව ජල ඉල්ලුම කළමනාකරණය සහතික කරනු ලබයි.
2. 2020 වන විට පාසල්වල ජල සැපයුම සහ සෞඛ්‍යාරක්ෂාව හොඳින් රැක බලා ගැනීම සහ නඩත්තුව
3. ජල පිරියම් කිරීමේ සහ බෙදා හැරීමේ ක්‍රියාකාරකම්වලදී බලශක්ති කාර්යක්ෂමතා ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ලබයි.
4. දූෂකයා දඩුවම් විඳීමේ ප්‍රතිපත්තිය ජලය දූෂණය කරන කර්මාන්ත සහ ක්‍රියාකාරකම් සඳහා දැඩිව බලාත්මක කරනු ලබයි.
5. 2030 වන විට ජනගහණයෙන් 60%කට නල ජලය සහ සැවොම සඳහා ආරක්ෂිතව කළමනාකරණය කරනු ලැබූ පානීය ජලය සහතික කරනු ලබයි.
6. අයභාර නොවන ජලය පිළිබඳ වත්මන් ප්‍රතිපත්තියට අනුකූල වෙමින්, 2018 වන විට අයභාර නොවන ජලය සඳහා ඉලක්ක සකස් කරනු ලබන අතර 2030 වන විට අයභාර නොවන ජලය යටත් පිරිසෙයින් 20% කින් අඩු කරනු ලබයි.
7. පානීය ජල ව්‍යාපෘති සඳහා ජලය සපයන හායනය වූ සියලු ජලධාර 2025 වන විට ප්‍රතිසංස්කරණය කරනු ලබයි.
8. ජාතික වැසි ජල ප්‍රතිපත්තිය සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.
9. ජල සංරක්ෂණය සහ ආරක්ෂාව පිළිබඳ යහපත් පරිචයන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම පිණිස ඵලදායී ව්‍යාපාරයක් දියත් කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය භාර අමාත්‍යාංශ සමග සමීප සහයෝගීතාවයෙන් කටයුතු කරමින් ජල කළමනාකරණය බාර අමාත්‍යාංශය

සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන: ජල සම්පත්, වාරිමාර්ග, විදුලිබල හා බලශක්තිය, කර්මාන්ත, කෘෂිකර්මය, පරිසරය, සෞඛ්‍යය, පළාත් සභා සහ පලාත් පාලනය, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය, මුදල්, ජාතික ප්‍රතිපත්ති බාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

# 3. බලශක්තිය[6]

## 3.1 ප්‍රතිපත්ති මූලධර්මය

බලශක්තිය පිළිබඳ සවිඥානක, ආරක්ෂිත සහ බලශක්තිය මත පරායත්ත නොවන ජාතියක්

[6] ති.ස.ඉ.7 (බලශක්තිය) සහ 13 (දේශගුණික විපර්යාස) සම්බන්ධ සැලසුම් සමග අන්තර්බන්ධන සහ සියලු ආර්ථික අංශ සඳහා අදාළ වේ.

### 3.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. බලශක්තිය සැමට ලබා ගත හැකි සහ සාධාරණ මිලට ඇති දෙයක් බවට පත් කරන්න
2. බලශක්ති උත්පාදන මිශ්‍රණය සහේතුක කරන්න.
3. දේශීය බලශක්ති සම්පත් භාවිතය උපරිම කිරීම සහ බලශක්ති ස්වයං උත්පාදනය දිරිමත් කරන්න
4. පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර භාවිතය ප්‍රශස්ත කරන්න
5. සුහුරු ජාලක ප්‍රවර්ධනය කරන්න.
6. සමාජයේ කාර්යක්ෂම බලශක්ති භාවිතය ඉහල නංවන්න, එනම් බලශක්ති සූක්ෂම ප්‍රවාහනය, කර්මාන්ත සහ ගොඩනැගිලි සහ ඉදිකිරීම් අංශ
7. බලශක්ති සැපයුමේ සහ සේවාවන්හි ගුණාත්මකබව ඉහළ නංවන්න.
8. බලශක්ති අංශයේ සංවර්ධනය තුලට දේශගුණය සහ ආපදා ප්‍රත්‍යාස්ථිතිය මූලධාරා ගත කරන්න.

### 3.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. 2018 වන විට ස්ථාපිත කරනු ලබන ති.ප.නි.සංකල්ප අන්තර්ගත කරමින් නව ජාතික බලශක්ති ප්‍රතිපත්තියක්.
2. 2020 වන විට බලශක්ති ස්වයං පෝෂිතභාවය සඳහා ක්‍රියාකාරී සැලැස්මක්
3. නැවත වලංගු කරන ලද "ජාතිකව නිර්ණය කරනු ලැබූ දායකත්ව" සඳහා 2030 වන විට බලශක්ති අංශයේ විමෝචන ඉලක්ක සපුරා ගනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** විදුලිබල සහ බලශක්තිය භාර අමාත්‍යාංශය

**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** කර්මාන්ත, ප්‍රවාහන, පළාත් සභා සහ පලාත් පාලනය, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණය, කෘෂිකර්මය, ජලය, පරිසරය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය, මුදල්, ජාතික ප්‍රතිපත්ති බාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## 4. අපද්‍රව්‍ය[7]

### 4.1 ප්‍රතිපත්ති මූලධර්මය

ති.ප.නි. දර්ශනය අනුගමනය කරන්නා වූ ධූරාවලි මූලධර්ම මත පාදක, අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සවිඥානක ජාතියක්

### 4.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සියලු අපද්‍රව්‍ය ධාරා සඳහා දූෂකයා දඩුවම් විඳීමේ ප්‍රතිපත්තිය ආදේශ කරන්න.
2. සියලු අංශවල, විශේෂයෙන්ම කර්මාන්ත, කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය සහ ගෘහයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ති.ප.නි. යහපත් පරිචයන් ස්ථාපිත කරන්න.
3. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ආයතනික යාන්ත්‍රණ ශක්තිමත් කරන්න.
4. අපද්‍රව්‍යවලින් සම්පත් ආපසු ලබාගැනීම සහ එසේ ආපසු ලබාගත් සම්පත් නව්‍යකරණ අලෙවිය සඳහා ක්‍රියාකාරකම් සහ වගකීම් ඇති කරන්න.
5. නිර්දේශිත කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය සහ අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර ක්‍රමවේදය වඩා විධිමත් කරන්න, අභිවර්ධනය කරන්න සහ උත්ශ්‍රේණි කරන්න.
6. ඇසුරුම්කරණය සහ ඉලෙක්ට්‍රොනික වැනි ප්‍රමුඛ අපද්‍රව්‍ය ධාරාවන් ආශ්‍රිත නිෂ්පාදන සඳහා විස්තෘත නිෂ්පාදක වගකීම් සංකල්පය හඳුන්වා දෙන්න.

### 4.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. සියලු අපද්‍රව්‍ය පද්ධති සඳහා සර්වග්‍රාහී සහ සමෝධානික අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කරනු ලබයි.

[7] ති.ස.ඉ.2 (ආහාර), 9 (කර්මාන්ත) සහ 11 (නගර) සම්බන්ධ සැලසුම් සමග අන්තර්බන්ධන, සහ සියලු ආර්ථික අංශ සඳහා අදාළ වේ.

2. පළාත් පාලන ආයතන මට්ටම දක්වා ජාතික අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත සමුදායක් ස්ථාපිත කරනු ලබයි.
3. අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීම ඇතුලුව අපද්‍රව්‍ය සම්පත් භූවමාරු වැඩසටහනක් ස්ථාපිත කරනු ලබයි.
4. අවශ්‍ය විටකදී ප්‍රතිසාධන සහ ප්‍රතිචක්‍රියකරණ පහසුකම් සහිත සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපිත කරනු ලබන අතර විවෘත දහනය සඳහා නීති සහ රෙගුලාසි බලාත්මක කරනු ලබයි.
5. අපද්‍රව්‍ය කළමනාකරණ ධූරාවලිය යටතේ ගෘහස්ථ අපද්‍රව්‍ය ධාරා ඇතුලුව, සෑම පළාත් පාලන ආයතනයක් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ස්ථාපිත කරනු ලබයි.
6. දූෂකයා දඬුවම් ලැබීමේ ප්‍රතිපත්තිය සහ කර්මාන්ත අපද්‍රව්‍ය (උපද්‍රවකාරී සහ උපද්‍රවකාරී නොවන යන දෙයාකාරයේම අපද්‍රව්‍ය), ගොඩනැගිලි සහ ඉදිකිරීම්, කෘෂිකර්මය සහ කෘෂි-ආහාර පිරිසැකසුම, සංචාරක ව්‍යාපාරය සහ වෛද්‍ය අපද්‍රව්‍ය ධාරා වැනි විශේෂිත අපද්‍රව්‍ය පරිසර හිතකාමීව පිරියම් කිරීම සහ අපහරණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි හඳුන්වා දෙනු ලබයි.
7. අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මූල්‍ය යාන්ත්‍රණ ස්ථාපිත කරනු ලබයි.
8. පළාත් පාලන ආයතනවලට උචිත තාක්ෂණික සහාය ලබා දීමේ පද්ධතියක් ස්ථාපිත කරනු ලබන අතර සියලු පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිපුණ ශ්‍රම බලකායක් සංවර්ධනය කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** පරිසරය බාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** පළාත් සභා සහ පළාත් පාලනය, කර්මාන්ත, කෘෂිකර්මය, විදුලිබල හා බලශක්තිය, සෞඛ්‍යය, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය මුදල්, ජාතික ප්‍රතිපත්ති බාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

# 5. කර්මාන්ත[8]

## 5.1 ප්‍රතිපත්ති මූලධර්ම

මනා ආර්ථික සහ සමාජ සංවර්ධනය සඳහා හරිත කර්මාන්ත

## 5.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සියලු කර්මාන්තවලට සම්පත් කාර්යක්ෂම සුපිරිසිදු නිෂ්පාදනය අන්තර්ගත කරන්න.
2. පවත්නා කර්මාන්ත වඩා සම්පත් කාර්යක්ෂම සහ පරිසර හිතකාමී කර්මාන්ත බවට පරිවර්තනය කිරීම සඳහා පහසුකම් සපයන්න.
3. ජීවන චක්‍රය පුරා ශුන්‍යයට ආසන්න දූෂණය  කරා දිවෙන සම්පත් කාර්යක්ෂම ආකාරයකින් තිරසාර නිෂ්පාදන සහ සේවා නිපදවන නව කර්මාන්ත ව්‍යවසාය ප්‍රවර්ධනය කරන්න.
4. සම්පත් කාර්යක්ෂම සුපිරිසිදු නිෂ්පාදන සේවා සැපයුම වැඩි දියුණු කිරීම පිණිස දැනුම, යහපත් පරිචයන් සහ ශිල්පීය ක්‍රම බෙදා හදා ගන්න.
5. පරිසර හිතකාමී තාක්ෂණවේද සම්පාදනය, පැවැරුම සහ දේශීයව අනුවර්තනය දිරිමත් කරන්න, ඉහළ දූෂණයක් සහිත සහ අධිකව සම්පත් භාවිතා කරන කර්මාන්තවලට  වඩා තිරසාර වීම සඳහා නවතම තාක්ෂණවේද ප්‍රවර්ධනය කරන්න.
6. ප්‍රතිචක්‍රිය කරන ලද ද්‍රව්‍ය අඩංගු භාණ්ඩ නිෂ්පාදනය සහ මිලදී ගැනීම සහ කාර්මික සහජීවනය වැනි සංකල්ප අන්තර්ගත කරමින් පාරිසරික කාර්මික ජනපද ස්ථාපිත කිරීම සහතික කරන්න.
7. පරිසර හිතකාමී නිෂ්පාදන සහ සේවාවන්හි ආයෝජනය කරන්නා වූ, විශේෂයෙන්ම සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා හරිත මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශය ලබා දෙන්න.
8. හරිත කර්මාන්ත ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස  මූල්‍ය සහ බදු දිරිගැන්වීම් හඳුන්වා දෙන්න, ආදර්ශනය කළ හැකි හොඳම තාක්ෂණය ලබා ගන්න.
9. සියලු කර්මාන්ත හරිත වාර්තාකරණය සඳහා යොමුකරන්න.
10. කර්මාන්ත අංශය සංවර්ධනය සඳහා දේශගුණය සහ ආපදා ප්‍රත්‍යාස්ථිතිය මූල ධාරා ගත කරන්න.

[8] ති.ස.ඉ. 9 (කර්මාන්ත) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

## 5.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. පාරිසරිකව සංවේදී හෝ දූෂණය ඇති කරන කර්මාන්ත අංශ සඳහා 2025 වන විට සම්පත් කාර්යක්ෂම සුපිරිසිදු නිෂ්පාදනය අනිවාර්ය කරනු ලබයි.
2. ඉහළ නැංවුණු සම්පත් භාවිතා කාර්යක්ෂමතාව සහ පිරිසිදු සහ පාරිසරිකව යහපත් තාක්ෂණවේද සහ කාර්මික ක්‍රියාදාම වැඩියෙන් යොදා ගැනීම සහිතව, කර්මාන්ත තිරසාර කිරීම සඳහා 2030 වන විට කර්මාන්ත යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලබන අතර ඒවා නවීකරණය කරනු ලබයි.
3. සියලු කාර්මික ජනපද 2030 වන විට පාරිසරික කාර්මික ජනපද බවට පරිවර්තනය කරනු ලබයි.
4. කර්මාන්ත සඳහා හරිත මූල්‍ය යෝජනා ක්‍රම සහ පාරිසරික දිරිගැන්වීම් ස්ථාපිත කරනු ලබයි.
5. නිෂ්පාදන මිලකරණය සඳහා විස්තෘත නිෂ්පාදක වගකීම අන්තර් ගත කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** කර්මාන්ත භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** පරිසරය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය, ජල මිපාදනය, බලශක්තිය, සෞඛ්‍යය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය මුදල්, ජාතික ප්‍රතිපත්ති බාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

# 6. ආහාර[9]

## 6.1 ප්‍රතිපත්ති මූලධර්මය

සැවොම සඳහා සාධාරණ මිලකට ලබා ගත හැකි තිරසරව නිපදවන ලද හා ආරක්ෂිත ආහාර

## 6.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සමාජයේ සෑම කොටසක් සඳහාම ප්‍රමාණවත් පෝෂ්‍ය තත්ත්වයක් සහතික කරන්න.
2. රට තුළ පහසුවෙන් මිලයට ගත නොහැකි ආනයනය කරන ලද ආහාරවල ගුණාත්මකබව සහ ආරක්ෂාකාරීබව සහතික කරන්න.
3. ගුණාත්මක සහ ආරක්ෂාකාරී අතිරික්ත ආහාර නිෂ්පාදනය අපනයනය මගින් සැලකිය යුතු ආදායමක් ලබාගන්න.
4. තිරසර සහ සුරක්ෂිත පද්ධති අත්කර ගැනීම සඳහා ආහාර නිෂ්පාදනයේදී ඉඩම්, ජලය, පොහොර, පළිබෝධ නාශක, බලශක්තිය සහ මානව සම්පත් කාර්යක්ෂම භාවිතය වැඩි කරන්න.
5. කෘතිම පළිබෝධ නාශක සහ පොහොර භාවිතය අවම කර සම්ප්‍රදායික සහ කාබනික කෘෂිකර්මාන්තය සහ යහපත් කෘෂිකාර්මික පරිචයන් ආරක්ෂා කර ප්‍රවර්ධනය කරන්න.
6. පූර්ව සහ පශ්චාත් අස්වනු හානි අඩුකිරීම පිණිස වටිනාකම් සැපයුම් දාම ශක්තිමත් කර ආහාර පද්ධතිවල නාස්තිය අරමුණු කරන්න.
7. වෙළඳාම සහ නව වෙළඳපොළ වර්ධනය සඳහා පහසුකම් සපයමින්, අනෙකුත් රටවල් සමග පාරිසරික නාමාංකන යෝජනා ක්‍රම (ආහාර සහ ආශ්‍රිත ඇසුරුම්කරණය සම්බන්ධයෙන්) පිළිබඳ අන්‍යෝන්‍ය පිළිගැනීමේ ගිවිසුම් සකස් කරන්න.

## 6.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1 පෝෂ්‍යදායී ආහාර මිලදී ගත හැකි බව, ප්‍රවේශ්‍යතාව සහ සුලභතාව මගින් සමාජයේ සෑම කොටසක් සඳහාම ප්‍රමාණවත් පෝෂණ තත්වයක් සහතික කරනු ලබයි.
2 නව තාක්ෂණය සහිත සමෝධානික ශාක පෝෂක සහ පළිබෝධ කළමනාකරණය සහ ජෛව-කාබනික සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම හරහා කෘතිම පළිබෝධ නාශක සහ පොහොර භාවිත අවම කරනු ලබයි.
3 2020 වන විට සැපයුම් දාමයේ (පූර්ව/පශ්චාත් අස්වනු) ආහාර හානි 10% අඩු කරනු ලබන අතර 2030 වන විට තවත් 20% කින් අඩු කරනු ලබයි.
4 2020 වන විට ආහාර නාස්තිය 10% කින් අඩු කරනු ලබන අතර 2030 වන විට තවත් 20% කින් අඩු කරනු ලබයි.

[9] ති.ස.ඉ. 2 (ආහාර) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

5 2020 ට පෙර ආහාර නාමාංකන ප්‍රතිපත්ති සහ නීතිමය රාමුව සකස් කරනු ලබන අතර 2025ට පෙර ක්‍රියාත්මක කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** කෘෂිකර්මය භාර අමාත්‍යාංශය සමග වැවිලි කර්මාන්තය භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** ආහාර පිරිසැකසුම, කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර, ජල සම්පත්, වාරිමාර්ග, විදුලි බලය හා බලශක්තිය, කර්මාන්ත, පරිසරය, සෞඛ්‍යය, වැවිලි, රාජ්‍ය ආරක්ෂාව, සංචාරක ව්‍යාපාරය, ආපදා කළමනාකරණය, විද්‍යාව සහ තාක්ෂණවේදය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජන මාධ්‍ය සහ සන්නිවේදනය, මුදල්, ජාතික ප්‍රතිපත්ති භාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## 7. ගොඩනැගිලි සහ ඉදිකිරීම[10]

### 7.1 ප්‍රතිපත්ති මූලධර්මය

පාරිසරිකව තිරසාර සහ සමාජීයව පිළිගත හැකි, ආර්ථික වශයෙන් පවත්වා ගත හැකි සහ සංස්කෘතිකව පිළිගත හැකි ආපදා ප්‍රත්‍යාස්ථිථ, ජීවත්වීමට සුදුසු නගර, ගම් සහ නිවාස

### 7.2. ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සැපයුම් දාම ඇතුලුව ගොඩනැගිලි අංශයේ තිරසාරත්වය ප්‍රවර්ධනය කරන්න. (නිෂ්පාදනය කරන ස්ථානය ආසන්නයේ සිට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම, ගොඩනැගිලි භාවිතය අතරතුර සහ ගොඩනැගිලි උපකරණ උපයෝජනය සහ ආයු කාලය අවසානයේ සහේතුක විනාශ කිරීම)
2. තිරසරව නිපදවන ලද ද්‍රව්‍ය සහ සම්පත් කාර්යක්ෂම නව්‍යකරණ සැලසුම් සහ ඉදිකිරීම් ශිල්පීය ක්‍රම භාවිතය සහ නැවත භාවිතය සඳහා ඉදිකිරීම් අංශයට මග පෙන්වා පහසුකම් සපයන්න.
3. අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම, සම්පත් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ ගොඩනැගිල්ල භාවිතා කරන කාලය තුල නිරෝගිමත් ජීවිතයක් ඉවැඩි කිරීම පිණිස නිශ්ක්‍රීය ගෘහ නිර්මාණ ශිල්පය ප්‍රවර්ධනය කරන්න.
4. නිරෝගී ජීවිතයක් සඳහා පාරිසරික පා සලකුණ අවම කිරීම පිණිස බලශක්ති සහ ජල කාර්යක්ෂමතා උපකරණ ප්‍රවර්ධනය කරන්න.
5. තිරසර ගොඩනැගිලි ඉදිකිරීම අභිවර්ධනය කිරීම සහ යහපත් පරිචයන් බලාත්මක කිරීමට සහාය වන ජාතික නීති සැලසුම් කිරීම සහ සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කරන්න.
6. පාරිසරික බලපෑම් ඇගයීම වැනි පවත්නා නෛතික සාධන පත්‍ර සමාලෝචනය කරන්න, ශක්තිමත් කරන්න සවිබල ගන්වන්න.
7. නගරවල අහිතකර ඒක පුද්ගල පාරිසරික බලපෑම අඩු කරන්න.
8. ආපදා සහ දේශගුණික ප්‍රත්‍යාස්ථ ගොඩනැගිලි සහ ඉදිකිරීම් ප්‍රවර්ධනය කරන්න.

### 7.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. විශාල ගොඩනැගිලිවල ගොඩනැගිලි කළමනාකරණ පද්ධති හඳුන්වා දෙනු ලබයි.
2. අනාගතයේ ඉදිකරනු ලබන රාජ්‍ය අංශයේ සියලු ගොඩනැගිලි හරිත ගොඩනැගිලි සහතිකය සමග අනුකූල වන බවට සහතික කිරීම පිණිස පළාත් පාලන ආයතන රෙගුලාසි සංශෝධනය කරනු ලබයි.
3. රජයට අයත් හෝ රජය පාලනය කරනු ලබන ගොඩනැගිලිවල නිශ්චිත බලශක්ති සහ ජල පරිභෝජනය 2020 වන විට 10% කින්, 2025 වන විට 15% කින් සහ 2030 වන විට 20% කින් අඩු කරනු ලබයි.
4. විවිධ කාණ්ඩවල ගොඩනැගිලිවල බලශක්ති කාර්යසාධනය සඳහා පිල්සලකුණු ස්ථාපනය කරයි.
5. රාජ්‍ය අංශයේ සියලු නව ගොඩනැගිලි සඳහා පුනර්ජනනීය බලශක්ති සැපයුම් පද්ධති බලාත්මක කරනු ලබයි.
6. 2025 වන විට බස්නාහිර පළාතේ සුහුරු නගරයක ආදර්ශයක් තිබීම.
7. 2030 වන විට සැවොම සඳහා වාසයට උචිත නිර්මිත පරිසරයක්
8. තිරසර ගොඩනැගිලි ඉදිකිරීම සඵලව ක්‍රියාත්මක කිරීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කරනු ලබයි.

---

[10] ති.ස.ඉ. 11 (නගර) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

**නියමු අමාත්‍යාංශය:** නිවාස සහ ඉදිකිරීම් භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** පළාත් සභා සහ පළාත් පාලනය, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, විදුලිබල හා බලශක්තිය, මහාමාර්ග, විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය මුදල්, ජාතික ප්‍රතිපත්ති භාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## 8 ප්‍රවාහනය[11]

### 8.1. ප්‍රතිපත්ති මූලධර්මය

සමාජයට අවම සෞඛ්‍ය බලපෑමක් සහිතව සැවොම සඳහා කාල, බලශක්ති, සම්පත් කාර්යක්ෂම, ආරක්ෂිත සහ සඵල ප්‍රවාහන පද්ධතියක්

### 8.2. ප්‍රතිපත්ති ප්‍රකාශන

1. ඉහළ නැංවුණු ප්‍රවේශ්‍යතාව සඳහා සවලතාව පිළිබඳ 'හැකි අවම ප්‍රමාණය දක්වා අඩු කිරීමේ ප්‍රවේශය' යොදා ගන්න, " ගමන් කිරීමෙන් වැළකීම, වඩා කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රම කරා මාරු වීම සහ ඉන්ධන සහ වාහන තාක්ෂණවේද වැඩි දියුණු කිරීම' මත පදනම් වූ ප්‍රවාහන සැලසුම්කරණය
2. දැනට පවතින ප්‍රවාහන පද්ධති භාවිතය ප්‍රශස්ත කරන්න.
3. විශ්වසනීය, සාධාරණ මිල සහිත, සැප පහසු පොදු ප්‍රවාහන පද්ධති ප්‍රවර්ධනය කරන්න
4. අධික තදබදය සහිත පුද්ගලික ප්‍රවාහන ක්‍රමයක් වෙනුවට එම ක්‍රමයේ තදබදය අඩුකිරීම සඳහා උචිත අවස්ථාවන්හිදී පොදු ප්‍රවාහන සේවාවක් ප්‍රවර්ධනය කරන්න.
5. ප්‍රවාහන ක්‍රමය තෝරා ගැනීමේ අවස්ථාව ප්‍රවාහන සේවා භාවිතා කරන්නන්ට ලබා දෙන්න.
6. පොදු ප්‍රවාහනය ඒකාබද්ධ කිරීමක් සහිතව ගමනක් යාම සඳහා ප්‍රවාහන ක්‍රම එකකට වඩා භාවිතා කිරීම ප්‍රවර්ධනය කරන්න, මගී ඉල්ලුමට සරිලන පරිදි නාගරික ප්‍රදේශවල උචිත පරිදි උමං දුම්රිය පද්ධති හා ඒ හා සමාන ඉහළ ධාරිතාවක් සහිත පොදු ප්‍රවාහන පද්ධති සංවර්ධනය කරන්න.
7. තිරසර පොදු ප්‍රවාහන පද්ධති ප්‍රවර්ධනය කරනු පිණිස නියාමන මෙවලම් හඳුන්වා දෙන්න.
8. පොදු ප්‍රවාහනය සඳහා තත්ත්ව ප්‍රමිති හඳුන්වා දෙන්න.
9. පොදු ප්‍රවාහන ජාල සහ යටිතල පහසුකම් සංවර්ධනය සමග ඉඩම් පරිහරණය ඒකාබද්ධ කිරීම සහ ප්‍රශස්ත කිරීම ප්‍රවර්ධනය කරන්න.
10. කාර්යක්ෂම සැපයුම් දාම පද්ධතියක් ඇති කර ගැනීම පිණිස වඩාත්ම යෝග්‍ය අන්තර් භුවමාරු ඒකාබද්ධ කිරීම මගින් භාණ්ඩ ප්‍රවාහන පද්ධති සංවර්ධනය කරන්න

### 8.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. ප්‍රවාහන ක්‍රමවල බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරනු ලබයි
2. පොදු ප්‍රවාහනය යොදා ගන්නා මගී ප්‍රතිශතය ඉහළ නංවනු ලබයි.
3. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල නවීන මගී ප්‍රවාහන පද්ධති (උමං දුම්රිය, සැහැල්ලු දුම්රිය, තනි පීල්ලේ දුම්රිය, මගී බස්රථ ප්‍රවාහන සේවා) හඳුන්වා දෙනු සහ/ හෝ වැඩි දියුණු කරනු ලබයි.
4. විදුලි දුම්රිය හඳුන්වා දෙනු ලබයි.
5. ප්‍රවාහනය සුදුසු ජලමාර්ගවලට හඳුන්වා දෙනු ලබයි.
6. මගී කාලය අඩු වේ.
7. නගර මාර්ග පද්ධතියට පාපැදි සහ ඇවිදීමේ කාර්යය සඳහාම වෙන්වූ මංතීරු හඳුන්වා දෙනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** මහාමාර්ග අමාත්‍යාංශය සමග සහයෝගීතාවයෙන් ප්‍රවාහනය භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** විදුලිබල හා බලශක්තිය, පළාත් සභා සහ පළාත් පාලනය, නාගරික සංවර්ධනය, ආපදා කළමනාකරණය, කර්මාන්ත, කෘෂිකර්මය, විද්‍යාව සහ තාක්ෂණය, පරිසරය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය මුදල්, ජාතික ප්‍රතිපත්ති භාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

[11] ති .ස.ඉ. 7 (බලශක්තිය) 11 (නගර) සහ 13 (දේශගුණ විපර්යාස) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

## 9. සංචාරක ව්‍යාපාරය[12]

**9.1 ප්‍රතිපත්ති මූලධර්මය**

පාරිසරිකව, සමාජීයව, සංස්කෘතිකමය, සදාචාරාත්මකව වගකීම් සහිත සහ ආර්ථික වශයෙන් ස්ථායී ශ්‍රී ලාංකික සංචාරක කර්මාන්තයක්

**9.2 ප්‍රතිපත්ති ප්‍රකාශන**

1. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සියලු නිෂ්පාදන සහ සේවාවන්හි ( සංග්‍රහ කටයුතු / විනෝදකර අවස්ථා/ සිහිවටන ආදී) ති.ප.නි. යහපත් පරිචයන් ප්‍රවර්ධනය කරන්න.
2. හෝටල්, ආපන ශාලා, විනෝදාස්වාදය, සාප්පු, චාරිකා සංවිධායකයන්, සංස්කෘතික සංදර්ශන ආදී සංචාරක ව්‍යාපාරයේ සේවාවන්හි වර්ගීකරණ නිර්ණායකයන්ට ති.ප.නි. අංග හඳුන්වා දෙන්න.
3. සම්පත් කාර්යක්ෂමතාව සඳහා ආදර්ශයක් වීමට 'අධික සම්පත් භාවිතා කරන සංචාරක අංශය' දිරිමත් කරන්න.
4. සියලු සංචාරකයන්ට තිරසාර සංචාරක ව්‍යාපාරයක සියලු දෑ ඇතුලත් ජීවන අත්දැකීමක් සපයන්න.
5. ස්වභාවික සම්පත් සහ වනජීවී සංරක්ෂණය සහ ජෛව සහ සංස්කෘතික විවිධත්වය ඉහළ නැංවීම සඳහා වූ මෙවලමක් ලෙස සංචාරක ව්‍යාපාරය යොදා ගන්න.
6. සංචාරක අංශය සංවර්ධනය තුලට දේශගුණය සහ ආපදා ප්‍රත්‍යාස්ථිතිය මූලධාරා ගත කරන්න.

**9.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ**

1. සංචාරක කර්මාන්තයේ ති.ප.නි. යහපත් පරිචයන් භාවිතය ඉහළ නැංවීම පිණිස නියාමන රාමුව ශක්තිමත් කරනු ලබයි.
2. තිරසාර සංචාරක ව්‍යාපාරයට වටිනාකම් එකතු කිරීම පිණිස සියලු පාර්ශවකරුවන් අතර සමීප අන්තර්ක්‍රියා/සහයෝගීතාව සඳහා පහසුකම් සැපයීම පිණිස සියලු සංචාරක ප්‍රදේශවල උපදේශක යාන්ත්‍රණ ස්ථාපනය කරනු ලබයි.
3. 2020 වන විට සංචාරක හෝටල් සහ ආපනශාලාවන්හි ති.ප.නි. අංග සහිත වර්ගීකරණ නිර්ණායක ස්ථාපිත කරනු ලබයි.
4. පරිසර හිතකාමී දිවයින් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව ලෝකයාට පෙන්නුම් කිරීම සඳහා තෝරාගත් ප්‍රදේශ වලට වැඩියෙන් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම වැඩි කරනු ලබයි.
5. ජාත්‍යන්තර ප්‍රමිතීන් ප්‍රකාරව 'පාරිසරික සංචාරක ව්‍යාපාරය' දිරිමත් කරනු ලබයි.
6. පාරිසරික සහ සංස්කෘතික වශයෙන් සංවේදී සංචාරකයන් අතර ජනප්‍රිය ස්ථාන සහ ප්‍රදේශ ඒවායේ ඉසිලුම් ධාරිතාව නිසි අවධාරණය සහිතව කළමනාකරණය කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** සංචාරක කර්මාන්තය භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** සංස්කෘතිය, අභ්‍යන්තර කටයුතු, පරිසරය, සෞඛ්‍යය, විදේශ කටයුතු, කර්මාන්ත, ප්‍රවාහනය, කෘෂිකර්මය, විදුලිබල හා බලශක්තිය, ආපදා කළමනාකරණය, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය මුදල්, ජාතික ප්‍රතිපත්ති භාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## 10. සෞඛ්‍යය[13]

**10.1 ප්‍රතිපත්ති මූලධර්මය**

---

[12] ති .ස.ඉ. 11 (නගර) සහ 15 (වනජීවී) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

[13] ති .ස.ඉ. 3 (සෞඛ්‍යය) සමග අන්තර්බන්ධන, සහ අනෙකුත් අංශ හා සම්බන්ධ බලාත්මක ප්‍රතිපත්ති (විද්‍යාව සහ තාක්ෂණය, අධ්‍යාපනය සහ සන්නිවේදනය සහ හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය) ආදේශ කරයි.

තිරසර පරිභෝජන භාවිතයන් සහිත හරිත පරිසරයක ජීවත් වන නිරෝගී ජාතියක්

## 10.2 ප්‍රතිපත්ති ප්‍රකාශ

1. සෞඛ්‍ය අංශයේ සියලු මට්ටම්වලදී තිරසර පරිභෝජන භාවිතයන් සහතික කරන්න.
2. සියලු සෞඛ්‍ය ප්‍රතිපත්ති තුල තිරසර පරිභෝජන භාවිතයන් සහ මූලධර්ම අන්තර්ගත කරන්න.
3. සියලු සෞඛ්‍ය සේවා ආයතන හරිත සහ සෞඛ්‍ය සම්පන්න කාර්ය සැකසුම් බවට පරිවර්තනය කරන්න.
4. සෞඛ්‍යසේවාවේ සම්ප්‍රදායික යහපත් පරිචයන් ප්‍රවර්ධනය කරන්න.
5. ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය ශක්තිමත් කරන්න
6. නිරෝගී ජීවන රටා ප්‍රවර්ධනය කරන්න.

## 10.3 ප්‍රතිපත්ති ඉලක්ක

1. 2020 වන විට සෞඛ්‍ය සේවා අංශයේ සියලු පාර්ශවකරුවන් අතර තිරසර පාරිභෝගික රටා පිළිබඳ අවබෝධය, එකඟතාව, සහ භාවිතාව ශක්තිමත් කරනු ලැබේ.
2. 2025 වන විට රෝගනාශක, නිවාරක, ප්‍රවර්ධක සහ පුනරුත්ථාපක සෞඛ්‍යාරක්ෂණ සැපයුම තුලට තිරසර පරිභෝජනය අන්තර්ගත කරමින් සෞඛ්‍ය සේවා පිරිවැය කාර්යක්ෂමතාව 25% කින් වැඩි දියුණු කරනු ලබයි.
3. 2030 වන විට සෞඛ්‍ය සේවා ආයතන හරිත සහ සෞඛ්‍ය සම්පන්න කාර්ය සැකසුම් බවට පරිවර්තනය කරනු ලබයි.
4. සෞඛ්‍ය සේවා තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා වූ යාන්ත්‍රණ ස්ථාපිත කරනු ලබයි.

**නියමු අමාත්‍යාංශය:** සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය භාර අමාත්‍යාංශය
**සහායක අමාත්‍යාංශ සහ නියෝජිතායතන:** අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, සනීපාරක්ෂාව, ජල සම්පාදනය, පරිසරය, ජනමාධ්‍ය, පළාත් සභා සහ පළාත් පාලනය භාර අමාත්‍යාංශ සහ නියෝජිතායතන

## වෙනත් අංශ හා සම්බන්ධ ප්‍රතිපත්ති

ප්‍රධාන තේමා සහ අංශ 10 ට අමතරව, මෙම එක් එක් ප්‍රධාන තේමාවන් ආවරණය කළ හැකි අනෙකුත් අංශ එකිනෙක සමග යා කරන පහතින් දැක්වෙන ප්‍රතිපත්ති තුනක් (03) හඳුනාගෙන ඇත.
අ. අධ්‍යාපනය සහ සන්නිවේදනය
ආ. විද්‍යාව සහ තාක්ෂණවේදය
ඇ. රාජ්‍ය ප්‍රසම්පාදනය

## අ. අධ්‍යාපනය සහ සන්නිවේදනය

### අ.1 ප්‍රතිපත්ති මූලධර්මය

ති.ප.නි. පිළිබඳ දැනුවත්, සංවේදානක, අන්තර්ග්‍රහණීය සහ සවිබල ගන්වන ලද ජාතියක්

### අ.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. ජීවන නිපුණතාවක් ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියට ති.ප.නි. සංකල්ප හඳුන්වා දෙන්න.
2. ති.ප.නි. ප්‍රවර්ධනය කරන්නා වූ නව්‍යකරණ පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කරන්න.
3. සියලු ක්ෂේත්‍රයන්හි ති.ප.නි. ප්රවර්ධනය කිරීම පිණිස අවශ්‍ය අවම ජාතික මානව ප්‍රාග්ධන ප්‍රමාණය සංවර්ධනය කරන්න.
4. පුද්ගලික අංශයේ ති.ප.නි. පිළිබඳ ( සංකල්පය සහ එහි ප්‍රතිලාභ) දැනුවත්බව ප්‍රවර්ධනය කර එමගින් යහපත්/ තිරසර ජීවන රටාවක් සඳහා පදනම ලෙස ති.ප.නි. අගය කිරීමට පුරවැසියන් සංවේදී කරන්න.
5. ති.ප.නි. වෙත යොමු කිරීම සඳහා චර්යාමය වෙනස්කම් ඇති කිරීම පිණිස සන්නිවේදනය ඉවැඩි කරන්න.

6. ති.ප.නි. වෙත යොමු කිරීම සඳහා සමාජයේ චර්යාමය වෙනස්කම් සඳහා මාධ්‍ය ආචාර ධර්ම වැඩි දියුණු කරන්න.
7. පාරිසරික නාමාංකන වැනි මෙවලම් හරහා තිරසර නිෂ්පාදන සහ ක්‍රියාදාමවල බලපෑම පිළිබඳ තොරතුර වෙත ප්‍රවේශ වීමට ඇති අයිතිය සහතික කරන්න.
8. තොරතුරු හරහා තිරසර නිෂ්පාදන සහ සේවා සහ චර්යාමය වෙනස්කම් සඳහා පාරිභෝගික තේරීම්වලට මග පෙන්වන්න සහ උපකාර වන්න.
9. පාරිභෝගික තේරීම් සහ චර්යාවෙහි යහපත් පරිචයන් සහතික කිරීම සහ ධෛර්යමත් කිරීම පිණිස පුද්ගලික-රාජ්‍ය හවුල්කාරිත්වයන්හි වෙනස්කම් ඇති කිරීමට කටයුතු කරන්න.
10. ති.ප.නි. පිළිබඳ ජාතික බහු-පාර්ශවකාර වටමේස සාකච්ඡා වාරිකව පවත්වන්න.

### අ.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. මුල් ළමාවිය අධ්‍යාපන, පාසල් අධ්‍යාපන, විශ්වවිද්‍යාල අධ්‍යාපන, වෘත්තීය අධ්‍යාපන සහ වෘත්තීමය අධ්‍යාපන පද්ධතිවලට ජීවන නිපුණතාවක් ලෙස 2025 ට පෙර ති.ප.නි. හඳුන්වා දෙනු ලබයි.
2. පළාත් පාලන ආයතන ඇතුලුව රාජ්‍ය අංශයේ ආයතන තුළ තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය ප්‍රවර්ධනය කරනු ලබයි.
3. ති.ප.නි. පිළිබඳ සාමාන්‍ය මහජනතාව අතර ඉලක්ක කණ්ඩායම් සඳහා (සමාජීය) මාධ්‍ය වැඩසටහන් ප්‍රවර්ධනය කරනු ලබයි.
4. මහජනතාවට ති.ප.නි. පිළිබඳ ඊ-ඉගෙනුම් අවස්ථා සපයනු ලබයි.
5. ජාතික සර්වග්‍රාහී ති.ප.නි. ප්‍රතිපත්තියෙහි සහ ක්‍රියාකාරී සැලසුම් හෝ ආශ්‍රිත උපායමාර්ගවල හඳුනාගත් ප්‍රමුඛතාවන්ට ප්‍රතිචාර ලෙස අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රතිශෝධනයට සහාය දක්වනු ලබයි.
6. අධ්‍යාපනය පිළිබඳ ජාතික උපායමාර්ග සහ සංවර්ධන සැලසුම් තුළට ති.ප.නි. දර්ශක සහ අධීක්ෂණ රාමු අන්තර්ගත කරනු ලබයි.
7. 2020 වන විට නිෂ්පාදන සහ ක්‍රියාදාමයන්හි බලපෑම පිළිබඳව තොරතුරු දැන ගැනීමේ අයිතිය බලාත්මක කරනු ලබයි.
8. ති.ප.නි. පිළිබඳව පර්යේෂණ සහ නව්‍යකරණය සඳහා අරමුදල් ආධාර පිළියෙල කරයි.
9. ති.ප.නි. හි ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව පුද්ගලික අංශය දැනුවත් කරනු ලබයි.

## ආ. විද්‍යාව සහ තාක්ෂණවේදය

### ආ.1 ප්‍රතිපත්ති මූලධර්මය

තිරසර සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස ජීවන චක්‍රය චින්තනය මත පදනම් වූ විද්‍යාව සහ තාක්ෂණවේදය පිළිගනු ලබයි.

### ආ.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. සියලු අංශ අතර ති.ප.නි. පිළිබඳ බලදායී නව්‍යකරණ සංස්කෘතියක් නිර්මාණය කරන්න.
2. භාණ්ඩ සහ සේවාවන්හි තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය සහතික කරමින් විවිධ අංශ සඳහා අදාළ වන උචිත සම්පත් කාර්යක්ෂම තාක්ෂණවේද වර්ධනය කර ප්‍රවර්ධනය කරන්න.
3. ති.ප.නි. පිළිබඳ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජයග්‍රහණ කරා කර්මාන්ත සහ ජනතාවට පහසුවෙන් ප්‍රවේශ විය හැකි බව සහතික කරන්න.
4. තාක්ෂණික පැවරුම, රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව හරහා වාණිජකරණය සඳහා සම්පත් කාර්යක්ෂම තාක්ෂණවේද යෙදවුම් දිරිමත් කරන්න.
5. සියලු අංශයන්හි ති.ප.නි. පිළිබඳ දේශීය දැනුම පෝෂ්‍ය කිරීම පිණිස විද්‍යාව පාදක සාක්ෂි ලේඛන ගතකරන්න, ප්‍රකාශයට පත් කරන්න සහ ප්‍රවර්ධනය කරන්න.
6. වටිනාකම් සහ සැපයුම් දාම පුරා සුපිරිසිදු සහ වඩා ආරක්ෂිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම පිණිස ජීවන චක්‍ර චින්තනය සහ ජීවන චක්‍ර ඇගයුම් සඳහා දැනුම් පදනමක් සකස් කරන්න.
7. උපයෝගිතා කාර්යක්ෂමතාවෙහි වැඩි දියුණුවීම් සහතික කරමින් චර්යාමය සහ ජීවන රටා වෙනස්කම් සඳහා සිල්ලර වෙළන්දන්, පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සපයන්න.

8. හරිත නිෂ්පාදන සහ සේවාවන්හි තත්ව සහතික කරන්න.
9. තිරසාරත්වය කෙරෙහි ආකල්පමය, චර්යාමය සහ ජීවන රටා වෙනස්කම් සිදුකිරීම සඳහා පාරිභෝගිකයන් අභිප්‍රේරණය කරනු පිණිස ති.ප.නි. යහපත් පරිචයන් පිළිබඳව තාක්ෂණික සාක්ෂි, අධ්‍යාපනය සහ දැනුවත්බව සපයන්න.
10. සියලු අංශයන්හි තාක්ෂණවේද දත්ත බැංකු, දැනුවත්බව, ප්‍රවර්ධනය සහ ජාලගත කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය(තො.ස.තා) යොදාගන්න.

### ආ.3 ප්‍රතිපත්ති අභිමතාර්ථ

1. කර්මාන්තයන් වෙත ජීවන චක්‍ර ප්‍රවේශ විධිමත් කිරීමට පහසුකම් සපයනු ලබයි.
2. නිෂ්පාදන සැලසුම් ක්‍රියාදාමයන් තුලට ති.ප.නි. මූලධර්ම අන්තර්ගත කරනු ලබයි.
3. විද්‍යා සහ තාක්ෂණ ක්ෂෙත්‍රයේ ජයග්‍රහණ කර්මාන්ත සමග බෙදා හදා ගැනීම පිණිස යාන්ත්‍රණ ස්ථාපිත කරනු ලබයි.
4. කර්මාන්ත, සිල්ලර වෙළඳුන් සහ පාරිභෝගිකයන් හට හරිත නාමාංකන ප්‍රමිති හඳුන්වා දෙනු ලබයි.
5. සම්පත් මිලකරණය සඳහා ක්‍රමවේද හඳුන්වා දෙනු ලබයි.
6. ජෛව විවිධත්වය සහ පාරිසරික පද්ධති සේවා තක්සේරු කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දෙනු ලබයි.
7. තො.ස.තාක්ෂණයෙන් සබල කළ තාක්ෂණ වේද දත්ත බැංකු ස්ථාපිත කරනු ලබන අතර ජාලගත කිරීම හඳුන්වා දෙනු ලබයි.
8. ති.ප.නි. සාක්ෂාත් කරගැනීමේ ප්‍රගතිය ඇගයීම පිණිස ප්‍රධාන කාර්යසාධක දර්ශක ස්ථාපිත කරනු ලබයි.
9. ප්‍රගමන මට්ටම් සහිතව, ති.ප.නි. ජයග්‍රහණ තක්සේරු කිරීම සහ පිළිගැනීම පිණිස ජාතික ක්‍රමවේදයක් (ලෝකඩ- රිදී- රන්)

## ඇ. රාජ්‍ය ප්‍රසම්පාදනය

### ඇ.1 ප්‍රතිපත්ති මූලධර්මය

තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන නිසිලෙස අවබෝධ කර ගෙන ආදේශ කරනු ලබයි.

### ඇ.2 ප්‍රතිපත්ති ප්‍රකාශන

1. ධාරිතාවය ගොඩ නගා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳව රාජ්‍ය අංශයේ ආයතන සවිබල ගන්වන්න.
2. අදාළ සියලු අංශයන්හි සහ සැලකිය යුතු බලපෑමක් සහිත එක් එක් නිෂ්පාදනය සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන පරිචයන් ආදේශ කරන්න.

### ඇ.3 ප්‍රසම්පාදන අභිමතාර්ථ

1. 2020 ට පෙර අදාළ අංශයන්හි තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා පරිපාලන සහ නීතිමය රාමුවක් ස්ථාපිත කරනු ලබයි.
2. සැලකිය යුතු පාරිසරික බලපෑම් සහිත ප්‍රධාන නිපැයුම් කාණ්ඩ සඳහා ජීවන චක්‍ර දත්ත සමුදායන් 2025 වන විට නිර්මාණය කරනු ලබයි නැතහොත් යාවත්කාලීන කරනු ලබයි.
3. සැලකිය යුතු බලපෑමක් ඇති අදාළ අංශයන්හි යටත් පිරිසෙයින් ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩ 5ක 2020 ට පෙර සහ 2030 වන විට යටත් පිරිසෙයින් නිෂ්පාදන කාණ්ඩ 50% ක තිරසර රාජ්‍ය ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.